# 2016-2024

# අ.පො.ස. සා.පෙළ

# ඉතිහාසය

## කෙටි ප්‍රශ්න හා පිළිතුරු

කේ. ඒ. චතුරංග අඹන්පිටිය

## 2016

1. 'වංසත්ථප්පකාසිනී' කවර වංසකථාවකට ලියන ලද ටීකාවක් ද?
(1) දීපවංසය (2) මහාවංසයේ මුල් කොටස
(3) ථූපවංසය (4) බෝධිවංසය

2. පුරාණ කාලයට අයත් සාහිත්‍ය, ආගමික තොරතුරු හා වංසකථා ලියැවී ඇත්තේ,
(1) පුස්කොළ පොත්වල ය. (2) ගල් පුවරු මත ය.
(3) කටාරම්වල ය. (4) රන් සහ තඹපත්වල ය.

3. තම අත්දැකීම් ඇසුරෙන් උඩරට රාජ්‍යය පිළිබඳව තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් ලියා ඇත්තේ,
(1) බැල්ඩියස් ය. (2) රිබෙයිරෝ ය.
(3) රොබට් නොක්ස් ය. (4) ක්වේරෝස් පියතුමා ය.

4. පොහොය දිනවල වෙළෙඳාම් කළ අයට දඩ නියම කළ බවට තොරතුරු ලැබෙන මූලාශ්‍රය මින් කුමක් ද?
(1) මිහින්තලා පුවරු ලිපිය (2) වේවැල්කැටිය ශිලා ලිපිය
(3) ගල්පොත ශිලා ලිපිය (4) සොරබොරවැව ටැම් ලිපිය

5. පුරවැසියකු ලෙස ඉතිහාස දැනුම වඩාත් ම ඵලදායි ලෙස භාවිත කළ යුතු වන්නේ,
(1) අතීත ශ්‍රී ලාංකික ශ්‍රී විභූතිය හැදෑරීම සඳහා ය.
(2) පැරණි තාක්ෂණික දැනුම නවීකරණය කර භාවිතයට ගැනීම සඳහා ය.
(3) අතීතයේ කළ වැරදි නැවත සිදු නොකිරීම සඳහා ය.
(4) අතීතය තුළින් වර්තමානය අවබෝධ කරගෙන අනාගතය හැඩගසා ගැනීම සඳහා ය.

6. ශ්‍රී ලංකාවේ ජාතික උරුමයක් වූ පුරාවස්තු රැක ගැනීම කළ යුතු වන්නේ මින් කවර කරුණක් නිසා ද?
(1) මතු පරපුරට පෙන්විය යුතු නිසා ය.
(2) ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කිරීමට හේතු වන නිසා ය.
(3) සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට හේතු වන නිසා ය.
(4) අතීත පාලකයන්ගේ කටයුතු ගැන අවබෝධයක් ලබා ගත හැකි නිසා ය.

7. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් ලැබී ඇති පතිරාජවෙල ප්‍රදේශයේ ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුව කාල නිර්ණය අනුව වසර,
(1) එක් ලක්ෂ විසිපන් දහසක් පැරණි ය. (2) අසූ දහසක් පැරණි ය.
(3) තිස්අට දහසක් පැරණි ය. (4) විසිඅට දහසක් පැරණි ය.

8. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ජීවන රටාව පිළිබඳව තොරතුරු ලබා ගැනීමට ඉවහල් වන සාධක බොහොමයක් ලැබී ඇති ස්ථානයක් ලෙස සැලකෙනුයේ,
(1) රිටිගල ය. (2) කදුරුගොඩ (කන්දරෝඩේ) ය.
(3) පාහියන්ගල ය. (4) කතරගම ය.

9. ශ්‍රී ලංකාවේ යකඩ භාවිතය පිළිබඳව මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ,
(1) ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේ දී ය.
(3) මුල් ඓතිහාසික යුගයේ දී ය. (4) ඓතිහාසික යුගයේ දී ය.

10. දඩයමින් ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා, ගොවිතැන කෙරෙහි යොමු වීමට බලපෑ මූලික පරිසරාත්මක හේතුව මින් කුමක් ද?
(1) පසෙහි සාරවත් බව වැඩි වීම
(2) දඩයමට සුදුසු සතුන් හිඟවීම
(3) පැවති ශීත දේශගුණය වෙනස් වී උණුසුම් දේශගුණයක් ඇරඹීම
(4) ජන සංඛ්‍යාව වැඩි වීම හා ව්‍යාප්ත වීම

11. මුල් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ ජනාවාසවල ව්‍යාප්තිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට වැදගත් වන සාධකය මින් කුමක් ද?
(1) ගම් වැව්වල ව්‍යාප්තිය (2) ලෙන්වල පිහිටීම
(3) රතු-දුඹුරු පස්වල ව්‍යාප්තිය (4) තැනිතලා බිම්වල ව්‍යාප්තිය

12. පරුමකවරුන්ට රජයේ ඉහළ තනතුරු ලබා දී දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ රජතුමා වන්නේ,
(1) පණ්ඩුකාභය ය. (2) දේවානම්පිය තිස්ස ය. (3) දුටුගැමුණු ය. (4) වසභ ය.

13. අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බවට ප්‍රබල සාධකයක් වන්නේ,
(1) පැරණි වෙදපොත් මෙරට භාවිතයේ පැවතීමයි.
(2) පුරාවිද්‍යාත්මක කැණීම්වලින් ශල්‍ය වෛද්‍ය උපකරණ හමුවීමයි.
(3) වෛද්‍යවරුන් ලෙස ප්‍රසිද්ධියට පත් රජවරු පිළිබඳව වංසකථාවල සඳහන් වීමයි.
(4) අතීත රෝහල් ගොඩනැගිලිවල නටබුන් හමුවීමයි.

14. ස්ථාන කිහිපයකින් ම අමුණු බැඳ දිගු දුරකට ඇළ මාර්ග මගින් ජලය ගෙනයාම සඳහා යොදා ගත් ගංගාව මින් කුමක් ද?
(1) මල්වතු ඔය (2) කලා ඔය (3) යාන් ඔය (4) මහවැලි ගඟ

15. තෙවරක් ම මෙරට පාලනය කළ රැජිනිය ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ මින් කවර තැනැත්තියක් ද?
(1) ලීලාවතී (2) කල්‍යාණවතී (3) සුගලා (4) චූල සීවලී

16. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා තමාගේ ශිලා ලිපි බොහොමයක ම භාවිත කළ රාජ්‍යත්වය පිළිබඳ සංකල්පය මින් කුමක් ද?
(1) දේවත්ව (2) බෝධිසත්ව (3) පර්වතරාජ (4) චක්‍රවර්ති

17. අතීතයේ දී 'ගව්ව' යන මිනුම භාවිත කරන ලද්දේ,
(1) කාලය මැනීමට ය. (2) දුර මැනීමට ය. (3) බර මැනීමට ය. (4) වපසරිය මැනීමට ය.

18. 'දකපති' යනුවෙන් සෙල්ලිපි මූලාශ්‍රවල සඳහන් වන්නේ,
(1) ජල බද්දකි. (2) ධාන්‍ය බද්දකි. (3) මත්ස්‍ය බද්දකි. (4) තොටුපොළ බද්දකි.

19. පහත ප්‍රකාශ සලකන්න.
- නගර නිර්මාණය ජ්‍යාමිතික සැලසුම් ආකෘතියෙන් මිදී නිදහස් ස්වරූපයකට පරිවර්තනය වීම.
- නගර මහා පරිමාණ ස්වරූපයක් පෙන්නුම් නොකිරීම.

ඉහත ප්‍රකාශ හා සම්බන්ධ නගර යුගලය වන්නේ මින් කුමක් ද?
(1) අනුරාධපුරය හා පොළොන්නරුව
(2) අනුරාධපුරය හා දඹදෙණිය
(3) දඹදෙණිය හා යාපහුව
(4) පොළොන්නරුව හා කුරුණෑගල

20. ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහතින් දක්වා ඇත.
A – පන්සිය පනස් ජාතක කථා පොත සිංහලට පරිවර්තනය කිරීම
B – උඩරට සාමන්ත පාලක 'ජෝතිය සිටුවරයා' කැරැල්ලක් ඇති කිරීම
C – චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කිරීම
D – අරාබි ජාතික ඉබන් බතූතා ලංකාවට පැමිණීම

ඉහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව පෙළගැස්වූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?
(1) A, C, B හා D (2) C, A, D හා B (3) C, D, A හා B (4) D, C, A හා B

21. මහනුවර රාජධානිය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) රටේ ඉහළ ම පාලන හා අධිකරණ බලතල රජතුමා සතු විය.
(2) පාලන කටයුතු සිදු වූයේ සම්ප්‍රදාය හා පෙර සිරිතට අනුව ය.
(3) සමාජ සම්බන්ධතා හා විවාහ කටයුතු කුල ක්‍රමය අනුව සිදු විය.
(4) රටේ සියලු ම පුරවැසියන් නීතිය හමුවේ සමාන ලෙස සැලකිණි.

22. ශ්‍රී ලංකාවට පෘතුගීසීන් පැමිණෙන විට යාපනයේ සිටි පාලකයා කවුරුන් ද?
(1) සංකිලි (2) පරරාජසේකරම් (3) පුව්රාජපණ්ඩාරම් (4) එදිරිමාන්නසිංහම්

- පහත වගුවේ සඳහන් A සිට J දක්වා තොරතුරු ඇසුරින් **23** සහ **24** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රජතුමා | ස්ථානය | හමුදා ප්‍රධානියා |
|---|---|---|
| A - පළමුවන විමලධර්මසූරිය | D - රන්දෙනිවෙල | G - දියෝගු ද මෙලෝ |
| B - පළමුවන රාජසිංහ | E - දන්තුරේ | H - කොන්ස්තන්තීනු ද සා |
| C - දෙවන රාජසිංහ | F - මුල්ලේරියාව | J - පේරෝ ලෝපේස් ද සූසා |

23. රත්දෙනිවෙල සටනට සම්බන්ධ වූ උඩරට රජතුමා සහ පෘතුගීසි හමුදා ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා G (2) B හා H (3) C හා H (4) C හා J

24. පළමුවන විමලධර්මසූරිය රජතුමා පෘතුගීසීන් සමග සටන් කළ ස්ථානය හා එහිදී පෘතුගීසි හමුදාව මෙහෙයවූ ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) D හා G (2) E හා H (3) E හා J (4) F හා G

25. රජතුමාට පුතෙකු නොසිටි විට බිසවගේ සහෝදරයාට රාජ්‍ය උරුමය හිමිකර දීමේ සම්ප්‍රදාය අනුගමනය කළේ පහත සඳහන් කවර වංශයකට අයත් පාලකයන් විසින් ද?
(1) මෞර්ය (2) ලම්බකර්ණ (3) කාලිංග (4) නායක්කර්

26. ලන්දේසීහු උඩරට රජවරුන් සමග කටයුතු කිරීමේ දී බොහෝ දුරට ගැටුම් ඇතිකර ගැනීමෙන් වැලකී සිටීමට ප්‍රධාන හේතුව මින් කුමක් ද?
(1) උඩරට රජවරුන් අමනාප කර ගැනීම තම වෙළෙඳ කටයුතුවලට බාධාවක් විය හැකි නිසා
(2) උඩරට රජවරුන්ගේ යුධ ශක්තිය හමුවේ ලන්දේසි යුධ බලය දුර්වලව පැවති නිසා
(3) වියදම් අඩු කර ගැනීම ලන්දේසි ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණය වූ නිසා
(4) උඩරටට හමුදා යැවීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වූ නිසා

- පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරින් **27** සහ **28** යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – සර්ව ජන ඡන්දබලය

B – ජාතික රාජ්‍ය සභාව

C – ජනමත විචාරණය

D – සෙනෙට් සභාව

E – සමානුපාතික නියෝජන ක්‍රමය

27. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සම්බන්ධ තොරතුරු පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා E

28. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) B හා C (2) B හා D (3) C හා D (4) C හා E

29. ඉංග්‍රීසීන්ට, උඩරට යටත් කර ගැනීමේ ව්‍යාපාරයේ දී උපායශීලී ලෙස කටයුතු කිරීමෙන් දායකත්වයක් සැපයූ පුද්ගලයා ලෙස සැලකෙනුයේ,
(1) මේජර් හුක් ය. (2) ඇහැලේපොළ අදිකාරම් ය.
(3) ජෝන් ඩොයිලි ය. (4) රොබට් බ්‍රවුන්රිග් ය.

30. ශ්‍රී ලංකාවේ බිහි වූ පැරණිතම දේශපාලන පක්ෂය වන්නේ,
(1) ලංකා සමසමාජ පක්ෂයයි. (2) එක්සත් ජාතික පක්ෂයයි.
(3) ලංකා කොමියුනිස්ට් පක්ෂයයි. (4) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.

31. ශ්‍රී ලංකාවේ පිහිටි ගොවිජනපද කිහිපයක් පහත දැක්වේ.

A – ගල්ඔය B – මින්නේරිය

C – කන්තලේ D – මිනිපේ

E – ගිරිතලේ

ඉහත ගොවිජනපද අතුරෙන් ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර ආරම්භ කරන ලද ඒවා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා E (2) B හා C (3) B හා D (4) C හා D

32. හෙන්රි ස්ටීල් ඕල්කොට්, අනගාරික ධර්මපාල, ආරුමුග නාවලර් හා සිද්දි ලෙබ්බෙ යන පුද්ගලයන්ගේ කටයුතුවල පොදු ලක්ෂණය වන්නේ,
(1) ආගමික හා අධ්‍යාපනික පුනරුදයේ මූලිකත්වය දැරීම ය.
(2) ශ්‍රී ලාංකික අතීත ශ්‍රී විභූතිය ලොවට පෙන්වීම ය.
(3) අමද්‍යප ව්‍යාපාරයේ මූලිකත්වය දැරීම ය.
(4) ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණ කිරීම ය.

**33.** මධ්‍යතන යුගයේ දී යුරෝපයේ ඇරඹි පුනරුදය නිසා විවිධ ක්ෂේත්‍රවල බොහෝ වෙනස්කම් සිදු විය. ලියනාඩෝ ඩා වින්චි ප්‍රසිද්ධියට පත්වූයේ මින් කවර ක්ෂේත්‍රයක ද?

(1) වෛද්‍ය විද්‍යාව (2) චිත්‍ර කලාව (3) දේශ ගවේෂණය (4) සාහිත්‍යය

**34.** විවිධ සොයා ගැනීම් කරන ලද පුද්ගලයන් කිහිප දෙනෙකුගේ නම් පහත සඳහන් වේ.

A - සැමුවෙල් මෝර්ස්
B - රොබට් පුල්ටන්
C - හම්ප්‍රි ඩේවි
D - ගුග්ලි මාර්කෝනි
E - ජෝන් මැකඩම්

ඉහත පුද්ගලයන් අතුරෙන් කාර්මික විප්ලව සමයේ සන්නිවේදන ක්ෂේත්‍රය හා සම්බන්ධ සොයා ගැනීම් කරන ලද පුද්ගලයන් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) A හා C ය. (2) A හා D ය. (3) B හා E ය. (4) C හා E ය.

**35.** කාර්මික විප්ලවය නිසා වර්ධනය වූ සමාජ ප්‍රතිඵලයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) භාණ්ඩ හා සේවා, ලාභයටත් ඉක්මනටත් මහා පරිමාණයටත් සැපයීමට හැකිවීම
(2) බහුජාතික ව්‍යාපාර වර්ධනය වීමට පටන් ගැනීම
(3) නාගරීකරණයේ වර්ධනය වේගවත් වීම
(4) මූල්‍ය හා බැංකු සේවා පුළුල් වීමට පටන් ගැනීම

● පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර **36** සිට **38** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. යුද ගැටුම්
2. පරිසර දූෂණය

B – 1. නාසිවාදය
2. හිට්ලර්

C – 1. මාර්ෂල් සැලැස්ම
2. ඇමෙරිකා එක්සත් ජනපදය

D – 1. පළමුවන ලෝක මහා සංග්‍රාමය
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය

**36.** පළමුවැන්නේ වැඩි වීම දෙවැන්න ඉහළ යාමට හේතු වන බව පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**37.** පළමුවැන්නේ වර්ධනයත් සමග දෙවැන්නේ බලවත් වීම පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**38.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් **නොපෙන්වන** ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**39.** දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ දී කොළඹ හා ත්‍රිකුණාමලය යන නගරවලට ගුවන් ප්‍රහාර එල්ල කළ රට කුමක් ද?

(1) ඇමෙරිකා එක්සත් ජනපදය (2) ජර්මනිය
(3) ජපානය (4) ඉතාලිය

**40.** නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කළ දකුණු ආසියානු රාජ්‍ය නායකයා මින් කවරෙක් ද?

(1) මාෂල් ටිටෝ (2) ජවහර්ලාල් නේරු (3) අබ්දුල් ගමාල් නසාර් (4) ලී ක්වාං යූ

## 2017

1. ක්‍රි.ව. හතරවන ශතවර්ෂයේදී පමණ රචනා කිරීම, තොරතුරු කෙටියෙන් දක්වා තිබීම, මෙරට පැරණිතම වංසකතාව වීම යන කරුණු අදාළ වන්නේ කවර මූලාශ්‍රයක් සම්බන්ධයෙන් ද?
(1) මහාවංසය (2) දීපවංසය (3) දාඨාවංසය (4) බෝධිවංසය

2. මෙරට ශාසන ඉතිහාසයට මුල් තැනක් දෙමින් රචිත ග්‍රන්ථයක් වන්නේ,
(1) රාජාවලියයි. (2) රාජරත්නාකරයයි. (3) නිකාය සංග්‍රහයයි. (4) විනයට්ඨකතාවයි.

3. වටිනා ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස සැලකෙන ශිලා ලිපි සම්බන්ධයෙන් **අදාළ නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) ශිලා ලිපිවල සඳහන් තොරතුරු සිද්ධීන්ට සමකාලීන වේ.
(2) වංස කතාවල දැක්වෙන තොරතුරු සනාථ කිරීමට උපකාරී වේ.
(3) අඛණ්ඩ දේශපාලන ඉතිහාසය ගොඩ නගා ගැනීමට යොදා ගත හැකි ය.
(4) සිංහල අක්ෂර පරිනාමය වූ ආකාරය දැන ගැනීමට ප්‍රයෝජනවත් ය.

4. බුලත්සිංහල, කුරුවිට වැනි ප්‍රදේශවල පිහිටි ලෙන් වැදගත් වන්නේ ඒවා,
(1) අනුරාධපුර-පොළොන්නරු යුගවලදී ආරක්ෂිත ස්ථාන වීම නිසා ය.
(2) පැරණි බෞද්ධ ආරාම ලෙස පැවතීම නිසා ය.
(3) බ්‍රාහ්මී අක්ෂර ලිපි ලිවීම සඳහා යොදා ගෙන ඇති නිසා ය.
(4) ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ ජීවන තොරතුරුවලට අදාළ සාධක හමුවන නිසා ය.

5. පහත දැක්වෙන පුද්ගලයන් අතුරෙන් ශ්‍රී ලංකාවට පැමිණ තොරතුරු අධ්‍යයනය කොට වාර්තා සැකසූවන් දැක්වෙන පිළිතුර කුමක් ද?

A – මෙගස්තිනිස් B – ෆාහියන් හිමි
C – ටොලමි D – ඉබන් බතූතා
E – රොබට් නොක්ස් F – හියුං සියෑං

(1) B, D හා F (2) C, D හා E (3) B, D හා E (4) A, B හා D

6. ක්‍රි.ව. පස්වන ශත වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විසූ රාජකීය කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් හා විලාසිතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඉවහල් වන්නේ කවරක් ද?
(1) සීගිරි පර්වතයෙහි ඇඳ ඇති කාන්තා රූප
(2) පුරා විද්‍යාත්මක කැනීම්වලින් හමුවූ ආභරණ කොටස්
(3) පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි ඇති චිත්‍ර සටහන්
(4) මහනුවර දළදා මාලිගාවේ ඇති චිත්‍ර


7. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් වැදගත් සිදුවීමක් වන්නේ,
(1) මැටි වළං භාවිතය ආරම්භ කිරීම ය.
(2) තිරිවානා හා කහඳගල් භාවිත කර ක්ෂුද්‍ර ගල් මෙවලම් නිපදවීම ය.
(3) ශාක හා සතුන් පුලුස්සා ආහාරයට ගැනීම ය.
(4) සංචාරක ජීවිතයක් ගත කරමින් ස්වාභාවික ගල්ගුහාවල ජීවත් වීම ය.

8. අදින් වසර 3000කට පමණ පෙරදී මෙරට විසූවන් දහනය සඳහා ඔක්සිජන් වායුව අවශ්‍ය බව දැන සිටි බවට ඉදිරිපත් කළ හැකි නිදසුනක් වන්නේ,
(1) කිතුල්ගල බෙලිලෙනින් හමු වූ පිළිස්සූ කැළෑ දෙල් ඇට ය.
(2) පුලුස්සා වර්ණවත් කළ මැටි බඳුන් ය.
(3) උඩ රංචාමඩමේ දී හමුවූ නිවාස නටබුන්වල පිළිස්සූ මැටි කැබලි ය.
(4) දිවයිනේ විවිධ ප්‍රදේශවල හමුවූ මැටිඔරු සුසාන ය.

9. මළ සිරුරු දිරා යන තුරු වළලා පසුව ගොඩ ගෙන හිස් කබල සූමට කිරීම, එහි ගුරුගල් ආලේප කිරීම යන චාරිත්‍ර විධි පිළිබඳව සාධක ලැබෙන්නේ මින් කවර කාල පරිච්ඡේදයක දී ද?
(1) පූර්ව ඓතිහාසික යුගය (2) ප්‍රාග් ඓතිහාසික යුගය
(3) මුල් ඓතිහාසික යුගය (4) ඓතිහාසික යුගය

10. ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශවල සිදුවූ බව නූතන පුරා විද්‍යාඥයන්ගේ මතය වී තිබේ. ඒ බව සනාථ කෙරෙන ගංගා නිම්නයක් වන්නේ කුමක් ද?
(1) ගල් ඔය (2) කිරිඳි ඔය (3) මල්වතු ඔය (4) යාන් ඔය

- යාබද රූපසටහනින් දැක්වෙන්නේ වැව් පද්ධතියකි. ඒ ඇසුරෙන් අංක **11** සහ **12** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**11.** මෙවැනි වැව් පද්ධති නිර්මාණය කිරීමේ එක් අරමුණක් වන්නට ඇත්තේ,
(1) ජලය සංරක්ෂණය කර ගැනීම ය.
(2) ගංවතුර පාලනය කර ගැනීම ය.
(3) දේශගුණයේ සමබරතාව රැක ගැනීම ය.
(4) පාංශු ඛාදනය වළක්වා ගැනීම ය.

**12.** මෙවැනි වැව් පද්ධති බහුලව දක්නට ලැබෙන්නේ,
(1) තෙත් කලාපයේ ය. (2) වියළි කලාපයේ ය.
(3) කඳුරට තෙත් කලාපයේ ය. (4) පහත රට අතරමැදි තෙත් කලාපයේ ය.

**13.** ලංකා ඉතිහාසයේ පළමුවරට ඔයක් හරහා අමුණක් තැනූ පාලකයා වශයෙන් සැලකෙනුයේ,
(1) වසභ රජු ය. (2) මහසෙන් රජු ය. (3) පළමුවන අග්බෝ රජු ය. (4) ඉළනාග රජු ය.

**14.** සැලසුම, තාක්ෂණය හා අලංකරණය යන කරුණු අතින් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම නාගරික උද්‍යානය ලෙස සැලකෙනුයේ,
(1) මහමෙවුනා උද්‍යානයයි. (2) දීප උද්‍යානයයි.
(3) සීගිරි උද්‍යානයයි. (4) රන්මසු උද්‍යානයයි.

**15.** විහාර ආරාමවලට කරන ලද පූජාවන් ගැන තොරතුරු ඇතුළත් ශිලාලිපිවල විවිධ සංකේත භාවිත කර ඇත. එහි හංසයා නිරූපණය කෙරෙන සංකේතයෙන් හැඟවෙන්නේ කුමක් ද?
(1) සෞභාග්‍යය (2) පාරිශුද්ධත්වය (3) ආරක්ෂාව (4) පූර්ණත්වය

**16.** අතීතයේදී මාර්ගවල දුර දැක්වීමට භාවිත කළ මිම්ම වූයේ,
(1) ගව්ව ය. (2) වියත ය. (3) කරිස ය. (4) අඟල ය.

**17.** පහත I තීරුවේ ශ්‍රී ලංකාවේ පැවති ග්‍රාමීය ජනාවාස කිහිපයක් දැක්වෙන අතර II තීරුවේ ඒවායේ ප්‍රධාන ආර්ථික කටයුත්ත කුමක්දැයි දැක්වේ.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. කසීකාර ගම | A - ධීවර කර්මාන්තය |
| 2. ගෝපාල ගම | B - වළං තැනීම |
| 3. කේවට්ට ගම | C - වඩු කර්මාන්තය |
| | D - ගොවිතැන |
| | E - සත්ත්ව පාලනය |

I තීරුව අනුව II තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A, C හා E (2) C, B හා D (3) D, E හා A (4) E, B හා D

**18.** ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු ආගමික මෙන් ම විවිධ සංස්කෘතීන්ට අයත් රටක් වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
(1) දූපතක් වශයෙන් පිහිටීම ය. (2) ස්වාභාවික සම්පත් ඇති රටක් වීම ය.
(3) සැපවත් දේශගුණයක් සහිත රටක් වීම ය. (4) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම ය.

**19.** පහත දැක්වෙන පාලක-පාලිකාවන් අතුරින් පොළොන්නරු රාජධානියට අයත් වන්නන් දැක්වෙන වරණය කුමක් ද?
A – වංකනාසික තිස්ස රජ B – කළ්‍යාණවතී රැජින
C – වසභ රජ D – නිශ්ශංකමල්ල රජ
E – මහසෙන් රජ F – සාහසමල්ල රජ
(1) A, C හා F (2) B, E හා F (3) A, B හා E (4) B, D හා F

**20.** අතීත සමාජයේ යම් අපරාධකරුවකු ගමක සැඟවී සිටින අවස්ථාවක ඔහු අල්ලා දීමේ වගකීම පැවරී තිබුණේ,
(1) ගමිකට ය. (2) ගමේ සියලු දෙනාට ය.
(3) දසගම් ඇත්තන්ට ය. (4) පරුමුකට ය.

**21.** පහත A සිට E තෙක් ලංකාවේ බලයට පත්වූ රජවරුන් කිහිපදෙනකු රාජ්‍යත්වයට පත්වීමට පෙර භාවිත කළ නම් දැක්වේ.
A – සපුමල් කුමරු B – මුත්තුසාමි කුමරු
C – ටිකිරි කුමරු D – මහා අස්ථාන කුමරු
E – කන්නසාමි කුමරු
ඒවා අධ්‍යයනය කර **පළමුවන රාජසිංහ, හයවන භුවනෙකබාහු** සහ **ශ්‍රී වික්‍රමරාජසිංහ** යන රජවරුන් භාවිත කළ නම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) C, A හා E (2) D, A හා B (3) C, A හා B (4) D, C හා B

22. ගම්පොළ රාජධානි සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ,
(1) හින්දු හා මහායාන බලපෑම නිසා පිළිම ගෙවල්වල දේවාල ඉදි කිරීම ය.
(2) සංදේශ කාව්‍ය ලිවීම ආරම්භ කිරීම ය.
(3) මව් පාර්ශ්වයෙන් රාජ්‍ය උරුමවීමේ ක්‍රමයක් ආරම්භ වීම ය.
(4) රාජ්‍ය උරුමය එකම රාජකීය පවුලක පිය-පුතු ක්‍රමයට හිමි වීම ය.

23. යාපන රාජ්‍යයේ බිඳ වැටීම සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) රාජ්‍ය උරුමකරුවන් අතර ඇතිවූ බල අරගලය (2) යාපන පාලකයන්ට නිත්‍ය හමුදාවක් නොසිටීම
(3) ස්වාභාවික ආරක්ෂාවක් නොතිබීම (4) යාපනයේ බහුතර ජනතාව පෘතුගීසින්ට පක්ෂපාතී වීම

- පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරින් **24** සහ **25** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A – දන්තුරේ සටනින් පෘතුගීසින් පරාජය කිරීම
B – කුසුමාසන දේවි දෝන කතිරිනා නමින් බෞතීස්මය ලැබීම
C – නායක්කර් වංශයට මහනුවර රාජ්‍යයේ උරුමය හිමි වීම
D – මෙරට සියම් නිකායේ ආරම්භය සිදු වීම

24. ඉහත සිදුවීම්වල නිවැරදි ඓතිහාසික අනුපිළිවෙළ දක්වන්න.
(1) A, B, D හා C (2) B, C, A හා D (3) A, C, B හා D (4) B, A, C හා D

25. C අක්ෂරයෙන් දැක්වෙන ඓතිහාසික සිදුවීම හා සම්බන්ධ රජතුමා කවුරුන් ද?
(1) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (2) කීර්ති ශ්‍රී රාජසිංහ
(3) ශ්‍රී විජය රාජසිංහ (4) රාජාධිරාජසිංහ

- පහත වගුවේ A සිට F තෙක් තොරතුරු ඇසුරින් **26** සහ **27** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| බලපෑ හේතුව | නායකයා | ආණ්ඩුකාරවරයා |
|---|---|---|
| A - රජයේ බදු ප්‍රතිපත්තිය | C - කැප්පෙටිපොල දිසාව | E - ටොරින්ටන් සාමි |
| B - රජකු නැතිවීම පිළිබඳ පසුතැවිල්ල | D - ගොංගාලෙගොඩ බණ්ඩා | F - සර් රොබට් බ්‍රවුන්රිග් |

26. ක්‍රි.ව. 1818 නිදහස් සටන හා සම්බන්ධවන තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, C හා E (2) B, C හා F (3) A, D හා F (4) B, D හා E

27. ක්‍රි.ව. 1848 නිදහස් සටන හා සම්බන්ධවන තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, D හා E (2) B, D හා E (3) A, C හා F (4) B, C හා F

28. 19 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ඇතිවූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය සම්බන්ධ අදහස් යුගල කිහිපයක් පහත දැක්වේ. මින් **නොගැළපෙන** යුගලය කුමක් ද?
(1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා - පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම
(2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි - පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ඇරඹීම
(3) ආරුමුග නාවලර්තුමා - උදයභාණු පුවත්පත ඇරඹීම
(4) සිද්ධි ලෙබ්බෙ මහතා - මරදානේ සහිරා විදුහල පිහිටුවීම

29. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය නිසා හටගත් පහත දැක්වෙන වෙනස්කම් අතරින් සංස්කෘතික වෙනස්කම් දෙකක් දැක්වෙන පිළිතුර කුමක් ද?
A – කම්කරු පන්තියක් බිහිවීම
B – බටහිර ඇඳුම් පැළඳුම්, ආචාර විධි මෙරට සමාජ ගත වීම
C – බටහිර අධ්‍යාපනය ව්‍යාප්ත වීම
D – වැටුපට සේවය කරන ශ්‍රමික පිරිසක් බිහිවීම
E – වෘත්තීය සංගම් පිහිටුවීම
(1) B හා C (2) C හා D (3) B හා E (4) C හා E

30. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා ලෙස පත්වූයේ කවුරුන් ද?
(1) සර්. ඩී.බී. ජයතිලක මහතා (2) පොන්නම්බලම් අරුණාචලම් මහතා
(3) එෆ්. ආර්. සේනානායක මහතා (4) පොන්නම්බලම් රාමනාදන් මහතා

31. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජාතික වැදගත්කමකින් යුත් කරුණක් සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා අනුග මනය කළ හැකි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය කුමක් ද?
(1) පාර්ලිමේන්තුවේ වාද විවාද පැවැත්වීම (2) ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කොට තීන්දුවක් ලබා ගැනීම
(3) ජනමත විචාරණයක් පැවැත්වීම (4) රටේ විද්වතුන්ගෙන් අදහස් විමසීම

- පහත දැක්වෙන A හා B ඇසුරෙන් 32 සහ 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A – වෙනිස් පිටියේ දිවුරුම
  B – සරයේවෝ සිද්ධිය

**32.** ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන්,
(1) A හා B අසත්‍ය වේ. (2) A හා B සත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**33.** පළමුවන ලෝක මහා සංග්‍රාමය සම්බන්ධයෙන්,
(1) A හා B අසත්‍ය වේ. (2) A හා B සත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

- පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර 34 සිට 36 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A – 1. නාවුක හෙන්රි
  2. දේශගවේෂණය
  B –1. දෙවන ලෝක මහා සංග්‍රාමය
  2. ජාතීන්ගේ සංගමය
  C – 1. කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අල්ලා ගැනීම
  2. පුනරුදය ඇරඹීම
  D –1. විශ්වය පිළිබඳ නව සොයා ගැනීම
  2. විද්‍යාවේ දියුණුව

**34.** දෙවැන්න ක්‍රියාත්මක වීම සඳහා පළමුවැන්නේ අනුග්‍රහය පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**35.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් **නොපෙන්වන** ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**36.** පළමුවැන්න දෙවැන්නේ වර්ධනයට හේතුවන බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

- ලෝකයේ ප්‍රධාන විප්ලව හා සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරින් 37 සහ 38 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - සාමය, ඉඩම් හා ආහාර
  B - ස්ටේට්ස් ජනරල් සභාව
  C - නියෝජනයක් නැත්නම් බදුත් නැත
  D - බැස්ටිල බන්ධනාගාරයට පහර දීම

**37.** රුසියන් විප්ලවයේ තේමා පාඨය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**38.** ඇමෙරිකන් නිදහස් සටන හා සම්බන්ධ තොරතුරක් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**39.** පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ආයතනය කුමක් ද?
- ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහලේකම් පත් කිරීම
- අන්තර් ජාතික අධිකරණයට විනිශ්චයකරුවන් පත් කිරීම
- නව සාමාජිකයින් සංවිධානයට බඳවා ගැනීම

(1) මහා මණ්ඩලය (2) භාරකාර මණ්ඩලය
(3) ආර්ථික හා සමාජීය මණ්ඩලය (4) මහලේකම් කාර්යාලය

**40.** අමෙරිකන් හෝ රුසියන් පිලට ගැති නොවීමේ අවශ්‍යතාව පෙන්වා දෙමින් ස්වාධීන සංවිධානයක් පිහිටුවීමේ ව්‍යාපාරයේ ප්‍රමුඛත්වය ගත් ආසියානු නායකයා,
(1) ජවහර්ලාල් නේරු ය. (2) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ය.
(3) අබ්දුල් ගමල් නසාර් ය. (4) මාෂල් ටිටෝ ය.

## 2018

**1.** මහාවංසය සුවිශේෂී වන්නේ,
(1) දේශපාලන හා ආගමික තොරතුරු අඛණ්ඩව ඇතුළත් වීම නිසා ය.
(2) සමකාලීන තොරතුරු රචනා කර තිබීම නිසා ය.
(3) පැරණිතම වංසකතාව වීම නිසා ය.
(4) අඩංගු තොරතුරුවල විශ්වසනීයත්වය නිසා ය.

**2.** පුරාවිද්‍යාත්මක කැණීම්වලින් චීන, රෝම, අරාබි හා ඉන්දියානු කාසි ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවලින් හමුවී ඇත. මෙයින් අනාවරණය වන වඩාත් ම වැදගත් කාරණය වන්නේ,
(1) ශ්‍රී ලංකාවේ දියුණු ආර්ථික රටාවක් පැවති බව ය.
(2) ශ්‍රී ලංකාවේ කාසි භාවිතය ප්‍රචලිතව පැවති බව ය.
(3) ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර දියුණු වෙළෙඳ සබඳතා පැවති බව ය.
(4) ලෝකයේ විවිධ රටවලින් සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නට ඇති බව ය.

**3.** ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී සංදේශ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය හා හටන් කාව්‍ය වැනි මූලාශ්‍ර වැදගත් වන්නේ පහත සඳහන් කුමන කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් ද?
(1) පොළොන්නරු අවධියේ සිට දඹදෙණි අවධිය දක්වා
(2) දඹදෙණි අවධියේ සිට ගම්පොළ අවධිය දක්වා
(3) ගම්පොළ අවධියේ සිට කෝට්ටේ අවධිය දක්වා
(4) කෝට්ටේ අවධියේ සිට මහනුවර අවධිය දක්වා

**4.** ශිලා ලිපිවල හිරු-සඳු සංකේතය යොදා ඇත්තේ කුමක් නිරූපණය කිරීම සඳහා ද?
(1) සෞභාග්‍යය (2) ස්ථාවරත්වය (3) වර්ෂාව (4) රාජ්‍ය අයිතිය

**5.** අප පුරාවස්තු රැකගත යුත්තේ ඒවා,
(1) ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්වන සාධක නිසා ය.
(2) සංචාරක ව්‍යාපාරයට වැදගත් වන නිසා ය.
(3) බෞද්ධ හා හින්දු වාස්තු විද්‍යාත්මක නිර්මාණ නිසා ය.
(4) අතීත ශිල්පීය දක්ෂතා පෙන්වන සාධක නිසා ය.

**6.** ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ තොරතුරු ලැබී ඇති වඩාත් ම පැරණි ස්ථානය ලෙස සැලකෙන්නේ,
(1) කුරුවිට බටදොඹ ලෙන ය.
(2) කිතුල්ගල බෙලි ලෙන ය.
(3) පාහියන්ගල ලෙන ය.
(4) අත්තනගොඩ අළු ලෙන ය.

**7.** පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන තාක්ෂණික නිර්මාණ හා කිසියම් සම්බන්ධතාවක් ඇත. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පිරිසිදු තිරුවාණ | A - වැව |
| 2. වේගවත් සුළං ධාරා | B - ක්ෂුද්‍ර මෙවලම් |
| 3. කුඩා කඳු ගැට | C - අමුණ |
| 4. ගඟක නැමීම | D - යකඩ නිස්සාරණය |

(1) A, B, C, D (2) B, D, A, C (3) C, B, A, D (4) D, A, B, C

**8.** ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගංගා නිම්නවලින් පිටත, කුඩා වැව් පද්ධති ආශ්‍රිතව ජනාවාස ව්‍යාප්තවීම ආරම්භ වූවා යැයි සැලකෙනුයේ,
(1) ප්‍රාග් ඓතිහාසික යුගයේදී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේදී ය.
(3) මුල් ඓතිහාසික යුගයේදී ය. (4) ඓතිහාසික යුගයේදී ය.

**9.** කුඩා වැව් පද්ධති භාරව කටයුතු කරන ලද්දේ,
(1) මපුරුමුක ය. (2) පරුමක ය. (3) ගමික ය. (4) ගහපති ය.

**10.** සංවිධානාත්මක මධ්‍යගත පාලනයක් සඳහා අංගසම්පූර්ණ අගනුවරක් ඉදි කළේ
(1) විජයයි. (2) අනුරාධයි. (3) උපතිස්සයි. (4) පණ්ඩුකාභයයි.

11. අතීත වාස්තු විද්‍යාත්මක නිර්මාණවලදී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බවට හොඳ නිදසුනක් වන්නේ,
(1) සීගිරි රජ මාළිගයයි. (2) ආලාහන පිරිවෙනයි.
(3) මිහින්තලා දාන ශාලාවයි. (4) මැදිරිගිරිය වටදාගෙයයි.

12. අතීත ශ්‍රී ලංකාවේ වගා කන්න තුනක් පැවති බවට සාධක හමුවේ. තුන්වැනි කන්නය වගාකිරීම තීරණය වූයේ,
(1) ගම් නායකයාගේ අභිමතය පරිදි ය. (2) පසුගිය කන්නයේ ලැබූ අස්වැන්න මත ය.
(3) ගොවීන්ගේ උනන්දුව මත ය. (4) ජලය ලබාගැනීමේ හැකියාව පරිදි ය.

13. අරාබි ජාතිකයින් ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා භාවිත කළ නාමය
(1) සෙයිලාන් ය. (2) තප්‍රොබේන් ය. (3) සෙරන්ඩිබ් ය. (4) තම්බපණ්ණි ය.

14. පොළොන්නරු යුගයේදී 'ගවුත කණු' භාවිත කර ඇත්තේ,
(1) මහා මාර්ගවල දුර දැක්වීමට ය. (2) රාජ්‍ය අයිතිය දැක්වීමට ය.
(3) ඇළ මාර්ගවල දුර දැක්වීමට ය. (4) අභයභූමිවල සීමා දැක්වීමට ය.

15. පහත A, B, C හා D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරෙන් කාලිංග මාඝ ආක්‍රමණය පැවති සමයේ ජීවත්වූවෙකුට දැනගන්නට **නොලැබෙන** සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක් ද?
A – ඉබන් බතූතා නම් අරාබි සංචාරකයා ශ්‍රී ලංකාවට පැමිණීම
B – රුවන්මැලි චෛත්‍යය ගොඩනැංවීම
C – පළමුවන කාශ්‍යප රජු සීගිරිය තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම
D – සපුමල් කුමරා කලක් යාපනය පාලනය කිරීම
(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා D

16. විශාල බරක් දැරිය හැකි වන සේ ඉදි කළ වාස්තු විද්‍යාත්මක නිර්මාණවලදී නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමයක් අනුගමනය කළ බවට සාධක ලැබෙන්නේ,
(1) රුවන්මැලිසෑයේ අත්තිවාරමේ ය. (2) මල්වතු ඔයේ ගල් පාලමේ ය.
(3) මාදුරු ඔයේ සොරොව්වේ ය. (4) සීගිරි මහ වැව් බැම්මේ ය.

17. ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම සඳහා කාන්තාවගේ දායකත්වය වැදගත් වූ බවට දිය හැකි හොඳම නිදසුන වන්නේ,
(1) පළමුවන විමලධර්මසූරිය දෝන කතරිනා විවාහ කර ගැනීම ය.
(2) පළමුවන විජයබාහු රජතුමා තිලෝකසුන්දරී කුමරිය සමග විවාහ වීම ය.
(3) පාණ්ඩ්‍ය කුමරකු සමග මිත්තා කුමරිය විවාහ වීම ය.
(4) සාලිය කුමරු අශෝකමාලා සමග විවාහ වීම ය.

18. 'චෙන් හෝ' නම් සෙන්පතියා යටතේ මෙරටට එල්ල වූ චීන හමුදා ආක්‍රමණයක් ගැන සඳහන් වන්නේ කුමන පාලන යුගයකදී ද?
(1) දඹදෙණිය (2) යාපහුව (3) ගම්පොළ (4) කෝට්ටේ

19. යුරෝපා ජාතීන් ශ්‍රී ලංකාවේ කුමන වෙළෙඳ ද්‍රව්‍යයක් ලබාගැනීම සඳහා ඇඩි තරගයක නිරත වී ද?
(1) කුරුඳු (2) මැණික් (3) පුවක් (4) ඇත් දළ

20. පහත A සිට F දක්වා දී ඇති පාලකයන් අතුරෙන් පෘතුගීසි විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළ පාලකයන් අඩංගු පිළිතුර තෝරන්න.
A – දොන් ජුවන් ධර්මපාල B – එදිරිමාන සිංහම්
C – සංකිලි D – පළමුවන රාජසිංහ
E – හත්වන බුවනෙකබාහු F – වරෝද්‍ය
(1) A හා B (2) B හා C (3) C හා D (4) E හා F

21. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන යුගයේදී සිදු කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒවා සිදු වූ ඓතිහාසික අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර කුමක් ද?
A – පළාත්බද නියෝජන ක්‍රමය
B – ව්‍යවස්ථාදායක හා විධායක සභාව
C – සෙනෙට් සභාව
D – සර්වජන ඡන්ද බලය
(1) A, B, D, C (2) A, C, D, B (3) B, A, D, C (4) B, D, A, C

- පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරෙන් **22** හා **23** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A – නව බදු වර්ග පැනවීම
  B – දේශීය නිලධාරීන් මගින් බදු එකතු කිරීම
  C – රදළ ප්‍රධානීන්ගේ නිලතල වෙනස් කිරීම
  D – පනවන ලද බදු, මුදලින්ම ගෙවීමට නියම කිරීම
  E – ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම

**22.** ක්‍රිස්තු වර්ෂ 1797 දී ඉංග්‍රීසි වෙළෙඳ සමාගමට එරෙහිව මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ලට බලපෑ හේතු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා C (2) A හා D (3) B හා D (4) C හා D

**23.** මියුරන් කොමිසමේ නිර්දේශ ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා E (3) B හා C (4) B හා E

- පහත A සිට F දක්වා ඇති ප්‍රකාශ ඇසුරෙන් **24** සිට **26** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A – 'මුස්ලිම් නෙයිසන්' පුවත්පත ඇරඹීම
  B – කොළඹ පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම
  C – කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කිරීම
  D – 'උදයභානු' පුවත්පත ඇරඹීම
  E – වෙසක් පොහොය දිනය, නිවාඩු දිනයක් බවට පත් කර ගැනීමට කටයුතු කිරීම
  F – ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීම

**24.** හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා D (3) B හා E (4) C හා E

**25.** සිද්ධි ලෙබ්බේ මහතා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා C (2) A හා D (3) B හා D (4) C හා D

**26.** ආරුමුග නාවලර්තුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා D (2) B හා C (3) C හා D (4) D හා F

**27.** ධනපති, කම්කරු හා මධ්‍යම යනුවෙන් සමාජ පන්ති තුනක් නිර්මාණය වූයේ කුමක ප්‍රතිඵලයක් ලෙසට ද?
(1) කාර්මික විප්ලවය (2) ප්‍රංශ විප්ලවය (3) පුනරුදය (4) ඇමෙරිකන් නිදහස් සටන

**28.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පුරවැසියකුගේ මූලික මිනිස් අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස කඩ වූ අවස්ථාවකදී පෙත්සමක් ඉදිරිපත් කළ යුත්තේ,
(1) අභියාචනාධිකරණයට ය. (2) ශ්‍රේෂ්ඨාධිකරණයට ය.
(3) මහාධිකරණයට ය. (4) මහේස්ත්‍රාත් අධිකරණයට ය.

**29.** සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,
(1) පාර්ලිමේන්තු වාද-විවාද පැවැත්වීම ය. (2) මාධ්‍ය තුළින් කෙරෙන අදහස් විමසීම ය.
(3) ජනමත විචාරණයක් පැවැත්වීම ය. (4) සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාත්මක කිරීම ය.

**30.** යුරෝපයේ පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත් වූ පුද්ගලයින් I තීරුවේ ද, ඔවුන් ප්‍රසිද්ධියට පත් වූ ක්ෂේත්‍ර II තීරුවේ ද, දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. මයිකල් ආංජලෝ | A - දේශ ගවේෂණය |
| 2. බර්තොලමියුඩයස් | B - චිත්‍ර ශිල්පය |
| 3. විලියම් හාවේ | C - ආගමික ප්‍රතිසංස්කරණ |
| | D - වෛද්‍ය විද්‍යාව |

(1) A, C, D (2) B, A, D (3) B, C, D (4) C, B, D

**31.** ජර්මන් අධිරාජ්‍යයක් ගොඩනැගීමේ අරමුණින් කටයුතු කළ ප්‍රථම පාලකයා වූයේ,
(1) ඔටෝ වොන් බිස්මාර්ක් ය. (2) දෙවන විලියම් කෙයිසර් ය.
(3) වොන් වොල්ක් ය. (4) ඇඩොල්ෆ් හිට්ලර් ය.

- පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර **32** සිට **34** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. ජාතීන්ගේ සංගමය
2. එක්සත් ජාතීන්ගේ සංගමය

B – 1. ලෝක සාමය
2. ආර්ථික සම්බාධක

C – 1. දෙවන ලෝක මහා සංග්‍රාමය
2. ඊශ්‍රායලය

D – 1. පරිසර දූෂණය
2. කාර්මිකකරණය

**32.** පළමුවැන්නේ වැඩිවීමට දෙවැන්නේ වැඩිවීම හේතු වන බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**33.** පළමුවැන්නේ අසාර්ථකත්වය දෙවැන්නේ ආරම්භයට හේතු වූ බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**34.** දෙවැන්න පළමුවැන්නේ ප්‍රතිඵලයක් බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**35.** දෙවන ලෝක යුද්ධයෙන් පසු මාර්ෂල් සැලැස්ම හඳුන්වාදීමේ අරමුණ වූයේ,
(1) විනාශයට පත් වූ යුරෝපයේ පරාජිත රටවල් නගා සිටුවීම ය.
(2) යටත් විජිතවල සමාජ-ආර්ථික කටයුතු ඉහළ නැංවීම ය.
(3) මිත්‍ර රටවල් ලෝක යුද්ධවලට අවතීර්ණ වීමට හේතු පහදා දීම ය.
(4) න්‍යෂ්ටික අවි නිෂ්පාදනය හා භාවිතය සීමා කිරීම ය.

**36.** පැසිස්ට්වාදයට එරෙහි වූවන් විනාශ කිරීම සඳහා "කළු කමිස හමුදාව" යොදාගත් ඒකාධිපති පාලකයා,
(1) බෙනිටෝ මුසෝලිනි ය. (2) ඇඩොල්ෆ් හිට්ලර් ය.
(3) වුඩ්රෝ විල්සන් ය. (4) වින්ස්ටන් චර්චිල් ය.

- පහත දැක්වෙන A හා B යටතේ ඇති තොරතුරු ඇසුරෙන් **37** හා **38** යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – බොස්ටන් තේ සාදය
B – පර්ල් වරායට පහරදීම

**37.** ඇමෙරිකන් නිදහස් සටන සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**38.** දෙවන ලෝක මහා සංග්‍රාමය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**39.** තම දේශපාලන බල කඳවුරෙහි සාර්ථකත්වය උදෙසා යුද්ධමය මැදිහත් වීමකින් තොරව උපායශීලීව කටයුතු කිරීමේ න්‍යාය හඳුන්වන නම කුමක් ද?
(1) න්‍යෂ්ටික අවිහරණය (2) ඉන්ධන නිෂ්පාදන පාලනය
(3) ආර්ථික සම්බාධක පැනවීම (4) සීතල යුද්ධය

**40.** නොබැඳි ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ පුරෝගාමියකු ලෙස කටයුතු කළ යුගෝස්ලෝවියානු ජනාධිපතිවරයා,
(1) අබ්දුල් ගමල් නසාර් ය. (2) මාෂල් ටිටෝ ය.
(3) ශ්‍රී ජවහර්ලාල් නේරු ය. (4) ලී ක්වාන් යූ ය.

## 2019

1. නාණක විද්‍යාව විෂයයෙන් හදාරනු ලබන්නේ මින් කුමක් පිළිබඳව ද?
(1) ලෝහ කර්මාන්තය (2) වාස්තු විද්‍යාව (3) කුඹල් කර්මාන්තය (4) පැරණි කාසි

2. අනුරාධපුර අවධියේ සිට කෝට්ටේ අවධියේ ආරම්භය දක්වා ඉතිහාසය හැදෑරීමේ දී උපකාරීවන දේශීය සාහිත්‍යයෙ මූලාශ්‍ර බොහොමයක් රචනා වී ඇත්තේ කවර අරමුණක් මුල්කර ගෙන ද?
(1) ආගමික (2) ආර්ථික (3) දේශපාලන (4) සමාජයීය

3. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූවා යැයි සැලකෙන 'මිනිහාගල්කන්ද' අයත් වන්නේ කුමන වාසස්ථාන වර්ගයකට ද?
(1) පහතරට තෙත් කලාපීය ලෙන් (2) පහතරට වියළි කලාපීය එළිමහන් කඳවුරු
(3) වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරු (4) පහතරට වියළි කලාපීය ලෙන්

4. පරුමකවරුන්ට පැවරී තිබූ මූලික කාර්යය වූයේ,
(1) රජතුමාට උපදෙස් දීම ය. (2) ගම්වැසියන්ගේ සුභසාධන කටයුතු ඉටු කිරීම ය.
(3) නගරයක් භාරව කටයුතු කිරීම ය. (4) වැව් පද්ධතියක් භාරව කටයුතු කිරීම ය.

- පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් **5** සහ **6** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - A – රුවන්වැලි මහා සෑය ඉදි කිරීම
  - B – ලම්භකර්ණ රාජවංශයේ ආරම්භක පාලකයා වීම
  - C – ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
  - D – ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරය ඇරඹීම
  - E – පළමුවරට විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීම

5. දුටුගැමුණු රාජ්‍ය සමයට අයත්වන සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා E

6. වසභ රාජ්‍ය සමයට අයත්වන සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා E

7. රාජ්‍යත්වයේ බලය ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රධාන ප්‍රතිඵලය වූයේ,
(1) බලය විමධ්‍යගත වීම ය. (2) රාජධානි අතර ගැටුම් ඇති වීම ය.
(3) ප්‍රාදේශීය පාලකයන් බලවත් වීම ය. (4) බලය මධ්‍යගත වීම ය.

8. ශ්‍රී ලංකාවේ ඇතැම් පාලකයන් අසල්වැසි රටවල් සමග විවාහ සබඳතා ඇති කර ගැනීමෙන් අනාවරණය වන්නේ,
(1) අසල්වැසි රටවල පාලකයන් හා ලාංකික පාලකයන් අතර සුහදතාව පැවති බව යි.
(2) ලාංකික රජවරුන්ගේ බලපරාක්‍රමය විදේශ රටවල ද ව්‍යාප්තව පැවති බව යි.
(3) ඥාති සබඳතා තුළින් දේශපාලන බලය ස්ථාවර කරගත් බව යි.
(4) විදේශ කුමාරිකාවන් සරණපාවා ගැනීම මෙරට රජවරුන්ගේ චාරිත්‍රයක්ව පැවති බව යි.

9. අතීතයේ දී විවිධ ජාතීන් අතුරෙන් වැඩි පිරිසක් මෙරටට පැමිණ ඇත්තේ,
(1) සංචාරය පිණිස ය. (2) වෙළඳාම පිණිස ය.
(3) අධ්‍යාපන කටයුතු පිණිස ය. (4) බලය අල්ලා ගැනීම පිණිස ය.

10. දීමනා හා සම්බන්ධ ඇතැම් ශිලාලිපිවල බල්ලා හා කපුටා සංකේතවත් කිරීමෙන් ජන සමාජයට ලබා දුන් පණිවුඩය වන්නේ,
(1) දීමනාවෙන් කොටසක් බලු කපුටන්ට ද හිමි බව ය.
(2) දීමනාවට බාධා කළවුන් මතු ආත්මයේ දී එවැනි සතුන් වී ඉපදෙන බව ය.
(3) දීමනාව බලු කපුටන්ගෙන් පවා ආරක්ෂා කළ යුතු බව ය.
(4) දීමනාවට අයත් ප්‍රදේශය බලු කපුටන්ට අභය භූමියක් වන බව ය.

11. කලාත්මක බව, ජල කළමනාකරණය හා තාක්ෂණය සංකලනය වූ විශිෂ්ට නිර්මාණයක් ලෙස අගය කළ හැක්කේ,
(1) සොරොව්ව ය. (2) ගල්පාලම ය. (3) යෝධ ඇළ ය. (4) කුට්ටම් පොකුණ ය.

12. අතීතයේ දී පානීය ජලය ලබා ගැනීමට ළිං සෑදීමේ දී විශාල ප්‍රමාණයේ මැටි බඳුන් කිහිපයක් ළිඳ තුළට බස්සවා, එහි බිත්ති ආවරණය කිරීමෙන් බලාපොරොත්තු වූයේ,
(1) ජලයේ කිවුල් බව නැති කිරීම ය. (2) ජලය වාෂ්ප වීම වළක්වා ගැනීම ය.
(3) ජලය වඩාත් සිසිල්ව තබා ගැනීම ය. (4) ජලය පිරිසිදුව ලබා ගැනීම ය.

- පහත තොරතුරු ඇසුරෙන් **13** සහ **14** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - A – විශාල ජල ධාරිතාවක් දරා සිටීම
  - B – වැව් ජලය ප්‍රධාන ඇළට නිකුත් කිරීම
  - C – ශක්තිමත්ව ඉදි කිරීම සඳහා පිහිටි ගලක් හෝ කඳු ගැට දෙකක් තෝරා ගැනීම
  - D – ගල් කුට්ටි යොදා ගංගාවක් හරස් කර ජලය වෙනත් දිශාවකට හැරවීම
  - E – වැවට එකතුවන රොන්මඩ ගුවත් කිරීම

**13.** වැව් බැම්ම හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා D

**14.** සොරොව් සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා E (2) B හා D (3) B හා E (4) C හා D

**15.** සැඟවී සිටින අපරාධකරුවකු අල්ලා ගැනීම සඳහා අතීත පාලකයන් යෙදූ උපක්‍රමය වන්නේ,
(1) අපරාධකරුගේ පවුලේ ඥාතීන් අත් අඩංගුවට ගැනීම ය.
(2) අපරාධකරු අල්ලා ගන්නා තෙක් ඔහු ජීවත් වූ ගමේ වැසියන්ගෙන් බද්දක් අය කිරීම ය.
(3) අපරාධකරු පිළිබඳ තොරතුරු සපයන අයට ත්‍යාග ලබා දීම ය.
(4) අපරාධකරු ඇල්ලීම සඳහා ක්‍රමවත් වරපුරුෂ සේවාවක් යොදා ගැනීම ය.

**16.** පැරණි ශ්‍රී ලංකාවේ කාන්තාව විශේෂ ගෞරවාදරයට පත්වීමට බල පෑ ප්‍රබලම සාධකය වූයේ,
(1) ස්වාමි භාර්යා ගෞරවය සුරකිමින් ජීවත් වීම ය.
(2) කුල සිරිත් ආරක්ෂා කරමින් ජීවත් වීම ය.
(3) මව්වරුන් ලෙස වගකීම් උසුලමින් කටයුතු කිරීම ය.
(4) සූප ශාස්ත්‍රය පිළිබඳ දක්ෂතා දැක්වීම ය.

- පහත වගුවේ A සිට F දක්වා ඇති තොරතුරු ඇසුරෙන් **17** සහ **18** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රජතුමා | ආක්‍රමණිකයා | ඓතිහාසික සිදුවීම |
|---|---|---|
| A - හතරවන භුවනෙකබාහු | C - චන්ද්‍රභානු | E - ඉබන්බතුතාගේ පැමිණීම |
| B - දෙවන පරාක්‍රමබාහු | D - චෙන්ෂෝ | F - බෙලිගල දළදාමැදුර ඉදි කිරීම |

**17.** දඹදෙණි රාජධානි සමය පිළිබඳ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, C හා E (2) A, D හා E (3) B, C හා F (4) B, D හා F

**18.** ගම්පොළ රාජධානි සමය පිළිබඳ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, C හා F (2) A, D හා E (3) B, C හා F (4) B, D හා E

**19.** මහනුවර රජ කළ නායක්කර් වංශික පාලකයන් අනුගමනය කළ රාජ්‍ය උරුම සම්ප්‍රදාය වූයේ රජුගෙන් පසුව, ඔහුගේ
(1) බිසවගේ සොහොයුරා රජවීම ය. (2) වැඩිමහල් සොහොයුරා රජවීම ය.
(3) පුතා රජවීම ය. (4) අගබිසව රජවීම ය.

**20.** උඩරට පාලන සංවිධානය තුළ බද්දෙ සංවිධානය යටතේ 'මඩිගෙ බද්ද' නමින් හැඳින් වූ කාර්යාංශයට පැවරී තිබූ කටයුත්ත කුමක් ද?
(1) ප්‍රවාහනය (2) රෙදි විවීම (3) ඇතුන් ඇල්ලීම (4) කුරුඳු තැලීම

**21.** උඩරට පාලකයන් හා පෘතුගීසින් අතර සටන් ඇති වූ ස්ථාන I තීරුවේ ද, ඒවා මෙහෙය වූ පෘතුගීසි කපිතාන් ජනරාල්වරුන් II තීරුවේ ද දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. දන්තුරේ | A - ජෙරනිමෝ ද අසවේදු |
| 2. බලන | B - දියෝගු ද මේලෝ |
| 3. රන්දෙණිවෙල | C - පේරෝ ලෝපේස් ද සූසා |
| 4. ගන්නෝරුව | D - කොන්ස්තන්තීනු ද සා |

(1) B, A, C, D (2) B, C, D, A (3) C, A, D, B (4) C, D, A, B

**22.** උඩරට රජුන් සමග කටයුතු කිරීමේ දී ලන්දේසීන් අනුගමනය කළ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණය වූයේ,
(1) හැකිතාක් ආර්ථික ලාභ ලබා ගැනීම ය. (2) රෙපරමාදු ආගම ප්‍රචාරය කිරීම ය.
(3) උඩරට රාජ්‍යයේ කොටස් අල්ලා ගැනීම ය. (4) විදේශ සබඳතා අවහිර කිරීම ය.

- පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවන හා දෙවන අදහස් අතර සම්බන්ධතාවය පරීක්ෂාකර බලා අංක **23** සිට **26** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. බැස්ටීලයට පහරදීම
 2. ප්‍රංශ විප්ලවය

B – 1. ජෝර්ජ් වොෂින්ටන්
 2. ඇමෙරිකානු විප්ලවය

C – 1. සාර් පාලනය
 2. රුසියන් විප්ලවය

D – 1. පරමාණු බෝම්බ හෙළීම
 2. පළමුවන ලෝක මහා සංග්‍රාමය

**23.** පළමුවැන්න බිඳවැටීම කෙරෙහි දෙවැන්නේ බලපෑම දැක්වෙන යුගලය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**24.** දෙවැන්නේ ආරම්භයට පළමුවැන්න ක්‍රියාත්මක වීම හේතු වූ බව දැක්වෙන යුගලය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**25.** දෙවැන්නේ සාර්ථකත්වයට පළමුවැන්නේ මගපෙන්වීම හේතු වූ බව දැක්වෙන යුගලය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**26.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවක් **නොදැක්වෙන** යුගලය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**27.** කාර්මික විප්ලව සමයේ මැකඩම් ක්‍රමය භාවිත කරන ලද්දේ,
(1) යකඩ හා වානේ නිපදවීමට ය. (2) දුම්රිය මාර්ග තැනීමට ය.
(3) පාලම් ඉදි කිරීමට ය. (4) මහාමාර්ග තැනීමට ය.

**28.** පහත දැක්වෙන කාර්මීකරණයේ ප්‍රතිඵල අතුරෙන් ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දැක්වෙන පිළිතුර කුමක් ද?
A – පරිසර දූෂණය ආරම්භ වීම
B – භාණ්ඩ නිෂ්පාදනය වේගවත් වීම
C – නාගරීකරණය ව්‍යාප්ත වීම
D – මුඩුක්කු හා පැල්පත් ව්‍යාප්ත වීම
(1) A (2) B (3) C (4) D

**29.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා හා සම්බන්ධ ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?
A – සිවිල් නිලධාරියකු වූ ජෝන් ඩොයිලිගේ සහාය ලබා ගැනීම
B – මුත්තුසාමි කුමරු උඩරට රජු වශයෙන් ප්‍රකාශයට පත් කිරීම
C – සෙන්පති මැක්ඩොවල්ගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කිරීම
D – රජුට හා ඔහුගේ ඥාතීන්ට උඩරට සිහසුනට තිබූ අයිතිය අහෝසි කිරීම
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**30.** 19 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය සම්බන්ධ අදහස් යුගල කිහිපයක් පහත දැක්වේ. ඒවායින් **නොගැළපෙන** යුගලය කුමක් ද?
(1) පංචමහාවාද පැවැත්වීම - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
(2) පෙරිය පුරාණම් ග්‍රන්ථය පරිවර්තනය කිරීම - ආරුමුග නාවලර්තුමා
(3) මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ඇරඹීම - රත්මලානේ ධම්මාලෝක හිමි
(4) කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම - සිද්දි ලෙබ්බෙ මහතා

**31.** පහත A සිට D දක්වා දී ඇති ප්‍රකාශ ඇසුරෙන් ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
A – කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස කටයුතු කිරීම
B – 1915 ඇති වූ කෝලාහලය මැඩලීමට යුධ නීතිය පැන වූ අවස්ථාවේ දී බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැගීම
C – නාට්‍ය මගින් මධ්‍යසාරවල අනිසි විපාක සමාජගත කිරීම
D – ලංකා ජාතික සංගමය පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීම
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

32. යාපනය රාජ්‍යය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) විජය කුලංගෙ යාපන රාජ්‍යයේ ආරම්භක පාලකයා ලෙස සැලකේ.
(2) පෘතුගීසි විරෝධියකු වූ විදිය බණ්ඩාර ආරක්ෂාව පතා යාපනයට පලායාම.
(3) 'යාල්පාන වෛපව මාලෛ' නැමති ග්‍රන්ථයේ යාපන රාජ්‍යය පිළිබඳ තොරතුරු ඇතුළත්ව ඇත.
(4) යාපනය කුරුඳු වගාවට ප්‍රසිද්ධ ප්‍රදේශයක් නිසා පෘතුගීසින්ගේ අවධානයට යොමුවීම.

33. A සිට D දක්වා ඇති තනතුරු නාම අතුරෙන් සෝල්බරි සහ 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමේ දී අහෝසි වූ තනතුරු නාම පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
A – ආණ්ඩුකාරවරයා
B – අග්‍රාණ්ඩුකාරවරයා
C – නාමික විධායක ජනාධිපති
D – විධායක ජනාධිපති
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

34. සෝල්බරි ආණ්ඩුක්‍රමයෙන් මෙරටට හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණයක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම (2) සර්වජන ඡන්ද බලය ලබා දීම
(3) පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වාදීම (4) විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම

35. ශ්‍රී ලංකාවේ පැරණිම දේශපාලන පක්ෂය මින් කුමක් ද?
(1) ලංකා සමසමාජ පක්ෂය (2) එක්සත් ජාතික පක්ෂය
(3) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (4) ලංකා කොමියුනිස්ට් පක්ෂය

36. පහත දැක්වෙන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන ලද්දේ කවර අග්‍රාමාත්‍යවරයාගේ පාලන කාලයේ දී ද?
- සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කිරීම
- වරාය හා බස් ජනසතු කිරීම
- විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්කිරීම

(1) ඩී. එස්. සේනානායක (2) ඩඩ්ලි සේනානායක
(3) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (4) සර් ජෝන් කොතලාවල

- පහත A, B, C හා D යටතේ දැක්වෙනුයේ ශ්‍රී ලංකාවේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි. එම තොරතුරු ආශ්‍රයෙන් ප්‍රශ්න අංක **37** හා **38**ට පිළිතුරු සපයන්න.

A – වියළි කලාපයේ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් ඉඩම් වී වගාවට යොදා ගැනීම
B – ඉහළ යන විදුලිබල ඉල්ලුම සපුරාලීමට විදුලිබල නිෂ්පාදනය වේගවත් කිරීම
C – රජය සතු ඉඩම් මහාපරිමාණ ව්‍යාපෘති සඳහා ලබා දීම
D – වතු බෝගවගාව තවදුරටත් ව්‍යාප්ත කොට ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම

37. ඉහත ප්‍රකාශ අනුව ගොවිජනපද පිහිටුවීමේ මූලික අරමුණ ඇතුළත් අක්ෂරය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

38. බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් මගින් අපේක්ෂිත අරමුණක් ඇතුළත් අක්ෂරය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

39. 'ටෙනිස් පිටියේ දිවුරුම' සහ 'ස්ටේට්ස් ජනරාල් සභාව' පහත සඳහන් කිනම් ඓතිහාසික සිදුවීමක් හා සම්බන්ධ ද?
(1) ඇමෙරිකානු නිදහස් සටන (2) ප්‍රංශ විප්ලවය
(3) රුසියානු විප්ලවය (4) පළමුවන ලෝක මහා සංග්‍රාමය

40. අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා රටකට ආර්ථික සම්බාධක පැනවීමේ වගකීම පැවරී ඇති, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතනය වන්නේ,
(1) මහ ලේකම් කාර්යාලය යි. (2) මහා මණ්ඩලය යි.
(3) ආර්ථික හා සමාජ මණ්ඩලය යි. (4) ආරක්ෂක මණ්ඩලය යි.

## 2020

1. මහාවංසයේ මුල් කොටස රචනා කරන ලද මහානාම හිමියන් වැඩ වාසය කළේ කුමන අධ්‍යාපන ආයතනයක ද?
   (1) අනුරාධපුරයේ දීඝසඳ සෙනෙවියා පිරිවෙන (2) පොළොන්නරුවේ ආළාහන පිරිවෙන
   (3) දඹදෙණියේ මයුරපාද පිරිවෙන (4) කෑරගල පද්මාවතී පිරිවෙන

2. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව තොරතුරු ඇතුළත් සෙල්ලිපි ලිවීම ආරම්භ කොට ඇත්තේ කුමන යුගයේ දී ද?
   (1) ප්‍රාග් ඓතිහාසික (2) පූර්ව ඓතිහාසික (3) මුල් ඓතිහාසික (4) ඓතිහාසික

3. අනුරාධපුර යුගයේ මුල් කාලීන ශිලා ලිපිවල භාවිත කර ඇති අක්ෂර හඳුන්වන්නේ මින් කවර නමකින් ද?
   (1) ඛරෝෂ්ඨී (2) නාගර (3) පල්ලව (4) බ්‍රාහ්මී

4. පැරණි රජවරුන් ජනතාව දැනුවත් කිරීම උදෙසා පනවන ලද විවිධ නීති ඇතුළත් සෙල්ලිපි කිහිපයක් I තීරුවේ ද ඒවායේ ඇතුළත් තොරතුරු II තීරුවේ ද සඳහන් වේ. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. වේවැල්කැටිය සෙල්ලිපිය | A - නැව්තොටකින් අය කළ තීරු බදු |
| 2. බදුලු ටැම්ලිපිය | B - වෙළෙඳපොළක කටයුතු සම්බන්ධ නීතිරීති |
| 3. ගොඩවාය සෙල්ලිපිය | C - ගම්වල අධිකරණ කටයුතු හා අපරාධ නීතිය පිළිබඳ තොරතුරු |
| | D - පරිසරය හා කෘෂිකාර්මික කටයුතුවලට අදාළ නීති |

   (1) A B C (2) C B A (3) C D A (4) D C B

5. ලෙන් ලිපි හෙවත් කටාරම් ලිපිවල වැඩි වශයෙන් දැක්වෙනුයේ,
   (1) රජවරුන් පිළිබඳ තොරතුරු ය. (2) රජයේ ආඥා පිළිබඳ තොරතුරු ය.
   (3) ලෙන් පිදූ පුද්ගලයන් ගැන ය. (4) ආරෝග්‍යශාලා සඳහා ඉඩම් ප්‍රදාන ගැන ය.

6. විවිධ විදේශීය බලපෑම්වලට නතු වුව ද, ශ්‍රී ලංකාවට අනන්‍ය වූ සංස්කෘතියක් ගොඩනැඟී ඇත්තේ මින් කවර හේතුවක් නිසා ද?
   (1) ඉන්දියානු උපමහද්වීපයට සමීපව පිහිටීම
   (2) විශේෂ හූ විෂමතාවයකින් යුක්ත දූපතක් වීම
   (3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම
   (4) පෙර අපර දෙදිග වෙළෙඳ මාර්ගයේ වැදගත් මධ්‍යස්ථානයක් වීම

7. හෝමෝසාපියන් මානවයා විසින් ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත් කරන ලදැයි අනුමාන කරන්නේ අදින් වසර කොපමණ ගණනකට පෙර සිට ද?
   (1) එක් ලක්ෂ විසිපන් දහසකට (2) අසූ දහසකට
   (3) තිස්අට දහසකට (4) විසිඅට දහසකට

8. අතීතයේ දී පෙරදිග රටවල, බහුතර කැමැත්තෙන් තෝරා පත්කරගත් පාලකයා හැඳින්වූයේ කුමන නමින් ද?
   (1) මපුරුමුක (2) ග්‍රාමික (3) මහාසම්මත (4) චක්‍රවර්ති

9. වියළි කලාපයේ කුඩා ගම්වැව් කේන්ද්‍රකර ගනිමින් ජනාවාස ව්‍යාප්ත වූයේ කුමන යුගයේ දී ද?
   (1) ප්‍රාග් ඓතිහාසික (2) පූර්ව ඓතිහාසික (3) මුල් ඓතිහාසික (4) ඓතිහාසික

10. මුල් ඓතිහාසික යුගයේ ගංගා නිම්නවලට පිටතින් ව්‍යාප්ත වූ ජනාවාසවල වැසියන් සිය යැපීම් ක්‍රමය ලෙස අනුගමනය කරන ලද්දේ,
   (1) සත්ත්ව පාලනයයි. (2) හේන් ගොවිතැනයි.
   (3) කුඹුරු ගොවිතැනයි. (4) වෙළෙඳාමයි.

11. පැරණි ශ්‍රී ලංකාවේ පරුමකවරුන් සතුව පැවති දේශපාලන බලය මධ්‍යගත පාලන ක්‍රමයක් බවට පත් කළ ප්‍රථම පාලකයා වූයේ,
   (1) පණ්ඩුකාභය රජතුමා ය. (2) කාවන්තිස්ස රජතුමා ය.
   (3) දුටුගැමුණු රජතුමා ය. (4) වසභ රජතුමා ය.

12. ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ විවිධ ශිල්පීන් හැඳින්වීම සඳහා භාවිත කරන ලද නම් I තීරුවේ ද ඔවුන් නියැලුණු ශිල්ප ක්ෂේත්‍ර II තීරුවේ ද දැක්වේ. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. කබර | A - රන් කර්මාන්තය |
| 2. විතකර | B - යකඩ කර්මාන්තය |
| 3. තුළදර | C - ඇත්දත් කැටයම් කර්මාන්තය |
| 4. දටික | D - චිත්‍ර ශිල්පය |
| | E - මැටි කර්මාන්තය |

(1) A B C D (2) B C A E (3) B D A C (4) E D A C

13. පැරණි ශ්‍රී ලංකාවේ වරාය ආශ්‍රිතව ගොඩනැගුණු ජනාවාස හැඳින්වූයේ කුමන නමින් ද?
(1) පට්ටානගාම (2) කේවට්ටගාම (3) මණිකාරගාම (4) කසීකාරගාම

14. ශ්‍රී ලංකාවෙන් නිර්මාණය වී දකුණු ආසියාවට පැතිරගිය බව සැලකෙන තාක්ෂණික නිර්මාණය කුමක් ද?
(1) බිසෝකොටුව (2) ස්ථූප (3) ජල උද්‍යාන (4) ඇඳිගම ඇත්පහන

15. නිශ්ශංකමල්ල රජතුමාගේ කාලයේ දී 'ගවුත කණු' සිටුවන ලද්දේ,
(1) පොහොය කර්මය සිදු කළ භූමි සීමාව දැක්වීමට ය.
(2) සඟ සතු කළ ඉඩම්වල සීමාවන් දැක්වීමට ය.
(3) මහාමාර්ගවල දුර දැක්වීමට ය.
(4) වැව් බැම්වල දිග දැක්වීමට ය.

16. සුවිශේෂී තාක්ෂණික කුසලතාවන්ගෙන් යුතු වූ, පැරණිතම වාරි නිර්මාණයක් ලෙස සංරක්ෂණය කර ඇත්තේ මින් කුමන සොරොව්ව ද?
(1) පදවිය (2) මාදුරුඔය (3) නාච්චදූව (4) මින්නේරිය

17. පහත A, B, C හා D යන ප්‍රකාශ අතුරෙන් වසභ රජතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
A – රාජ්‍ය අනුග්‍රහය යටතේ ප්‍රථම වැව කරවීම
B – චෝල ආධිපත්‍යයෙන් රට මුදාගැනීම
C – ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා වීම
D – රටේ අභ්‍යන්තර පාලනය විධිමත් කර, බදු අය කිරීම ක්‍රමවත් කිරීම
(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

18. පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් පොළොන්නරු යුගය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) බුද්ධදහමත්-සංස්කෘතියත් කෙරෙහි හින්දු බලපෑම් දැකිය හැකි ය.
(2) මාඝ ආක්‍රමණය නිසා පොළොන්නරු රාජධානිය බිඳ වැටිණි.
(3) මහාතිත්ථය පොළොන්නරු යුගයේ ප්‍රධාන වරාය වශයෙන් පැවතිණි.
(4) පාලන මධ්‍යස්ථානයක් ලෙස පළමුව පොළොන්නරුව තෝරාගත්තේ සොළීන් ය.

19. නිශ්ශංකමල්ල රජුගෙන් පසු පොළොන්නරු සිංහාසනය සඳහා කාලිංග සහ පාණ්ඩ්‍ය රාජවංශ අතර පැවති බල අරගලයේ දී පාණ්ඩ්‍ය වංශය නියෝජනය කළ කාන්තාව,
(1) සුගලා ය. (2) කළ්‍යාණවතී ය. (3) ලීලාවතී ය. (4) තිලෝකසුන්දරී ය.

20. ශ්‍රී ලංකාවේ පැවති පැරණි රාජධානි කිහිපයක නම් I තීරුවේ ද, එම රාජධානි හා සම්බන්ධ සිදුවීම් කිහිපයක් II තීරුවේ ද දැක්වේ. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. යාපහුව | A - අරාබි ජාතික ඉබන් බතුතා ශ්‍රී ලංකාවට පැමිණීම |
| 2. කුරුණෑගල | B - පිලිප් ද ඔලිවේරා යටතේ පෘතුගීසි හමුදා මෙහෙයුම |
| 3. ගම්පොළ | C - සිංහල ජාතක කථා පොත සම්පාදනය කිරීම |
| 4. යාපනය | D - ආර්ය චක්‍රවර්ති ශ්‍රී ලංකාව ආක්‍රමණය කර දළදාව පැහැරගෙන යාම |

(1) A D C B (2) B C D A (3) D B A C (4) D C A B

21. යාපනය රාජ්‍යය සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
(1) එහි පාලක පරපුර 'නායක්කර්' රජ වංශයයි.
(2) නල්ලූර් යාපන රාජ්‍යයේ අගනුවරයි.
(3) උඩරට රාජධානියේ මෙන් භෞතික පරිසරයක් එහි නොවීමයි.
(4) යාපන රාජධානිය බිහිවූයේ රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුවයි.

22. ඉන්දියන් සාගර කලාපයේ බල අරගලයේ දී ප්‍රංශ හා ඉංග්‍රීසි ජාතීන්ට ශ්‍රී ලංකාව වැදගත් වූයේ මින් කුමන කරුණක් සඳහා ද?
(1) ත්‍රිකුණාමල වරාය ලබාගැනීම (2) තම ආගම ප්‍රචාරය කිරීම
(3) කුළු බඩු වැනි වෙළෙඳ ද්‍රව්‍ය ලබාගැනීම (4) වතු වගාවට යොදාගත හැකි ඉඩම් ලබාගැනීම

23. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලින් පෘතුගීසීන් නෙරපා හැරීමට කෝට්ටේ පාලකයින් අපොහොසත් වීමට තුඩුදුන් ප්‍රධානම හේතුව වූයේ,
(1) කෝට්ටේ පාලකයන් අතර පැවති අසමගිකම ය.
(2) ඇතැම් සිංහල ප්‍රධානීන් පෘතුගීසීන්ට පක්ෂව කටයුතු කිරීම ය.
(3) කෝට්ටේ පාලකයින්ට ශක්තිමත් නාවුක බලයක් නොමැති වීම ය.
(4) මුහුදුබඩ පළාත්වල ජනතාව පෘතුගීසීන්ට සහාය දීම ය.

24. ක්‍රි.ව. 1815 උඩරට යටත් කර ගැනීම සඳහා බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාට විවිධ උපක්‍රම මගින් තොරතුරු ලබාදුන් පුද්ගලයා වූයේ,
(1) මැක්ඩෝවල් ය. (2) රොබට් ඇන්ඩෲස් ය.
(3) මේජර් හුක් ය. (4) ජෝන් ඩොයිලි ය.

25. I තීරුවෙහි දැක්වෙන සංකල්ප අනුපිළිවෙළ අනුව II තීරුවේ දැක්වෙන තොරතුරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සමාජවාදය | A - ධනෝපායන මාර්ගවලින් උපරිම ලාභ උපයාගැනීම |
| 2. ධනවාදය | B - සමාජය සතු ධන සම්පත් පිළිබඳ පොදු අයිතිය පිළිගැනීම |
| 3. රාජ්‍ය නිර්බාධවාදය | C - ආර්ථික කටයුතුවල දී රජයේ අවම මැදිහත් වීම |
| | D - යටත්විජිතවල සම්පත් මව්රටෙහි ප්‍රයෝජනයට යොදාගැනීම |

(1) A B C (2) B A C (3) B D A (4) D A B

26. යුරෝපයේ පුනරුද සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත් ම වෙනස වන්නේ,
(1) වංශාධිපතිවරුන්ගේ බලය වර්ධනය වීමයි. (2) ප්‍රාදේශීය රාජ්‍ය වෙනුවට ජාතික රාජ්‍ය බිහිවීමයි.
(3) රජුගේ බලතල සීමා වීමයි. (4) යටත්විජිත පිහිටුවා ගැනීමයි.

27. ජෝන් වයික්ලිෆ්, ජොන් හස් , ඉරාස්මස් හා මාටින් ලූතර් යන පුද්ගලයන් වඩාත් ප්‍රසිද්ධියට පත්වූයේ පහත සඳහන් කුමන කරුණක් සම්බන්ධයෙන් ද?
(1) භාෂාව හා සාහිත්‍යයේ පුනර්ජීවනයට සිදු කළ සේවය
(2) රෝමානු කතෝලික සභාවේ ක්‍රියා කලාපය විවේචනය කිරීම
(3) චිත්‍ර කලාවේ දියුණුවට දැක්වූ දායකත්වය
(4) විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කිරීම

28. මහනුවර රාජධානි සමයේ 'පරවේණිගම්' නමින් හඳුන්වන ලද්දේ,
(1) විහාරාරාම සඳහා පූජා කළ ඉඩම් ය.
(2) රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් ය.
(3) ගම්වැසියන් පරම්පරාගතව භුක්ති විඳි ඉඩම් ය.
(4) රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් ය.

29. 'ජනතා පරමාධිපත්‍යය' යන මූලධර්මයෙහි අර්ථය ඇතුළත් ප්‍රකාශය මින් කුමක් ද?
(1) මහජන ඡන්දයෙන් පාලකයන් පත් කිරීමට හා ඉවත් කිරීමට ඇති අයිතිය
(2) මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීමක දී සහනයක් ලබාගැනීමේ අයිතිය
(3) තමන් කැමති දේශපාලන අදහස් අනුව කටයුතු කිරීමේ නිදහස
(4) මාධ්‍ය මගින් රජය විවේචනය කිරීමේ අයිතිය

- පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරෙන් 30 සහ 31 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම
B – ද්විමණ්ඩල පාර්ලිමේන්තුව
C – බ්‍රිතාන්‍යයේ රජු/රැජින ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකත්වයෙන් ඉවත් වීම
D – පූර්ණ විධායක බලය සහිත ජනාධිපති ධුරය
E – ඔම්බුඩ්ස්මන් තනතුර ස්ථාපිත කිරීම

30. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය හා 1972 ජනරජ ආණ්ඩුක්‍රමය හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

31. 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

- පහත වගුවේ A සිට F දක්වා දී ඇති තොරතුරු ඇසුරෙන් 32 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| රට | සිදුවීම | ප්‍රතිඵලය |
|---|---|---|
| A. ජපානය<br>B. ජර්මනිය | C. ලුසිටානියා නැව ගිල්වීම<br>D. පර්ල් වරායට පහරදීම | E. ජාතීන්ගේ සංගමය බිහිවීම<br>F. පරමාණු බෝම්බ හෙළීම |

32. පළමුවන ලෝක මහා සංග්‍රාමයට අදාළ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A C E (2) A C F (3) B C E (4) B D F

33. දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් කිරීමට බලපෑ තීරණාත්මක සිදුවීම මින් කුමක් ද?
(1) ඉතාලි රාජ්‍ය නායකයා ඝාතනයට ලක්වීම
(2) ඇමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පිලට එකතු වීම
(3) ජර්මන් ගුවන් හමුදාව බ්‍රිතාන්‍ය අතින් පරාජයට පත්වීම
(4) ජපානයේ හිරෝෂිමා හා නාගසාකි නගරවලට පරමාණු බෝම්බ ප්‍රහාරයක් එල්ල වීම

34. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම සඳහා පදනම් වූයේ,
(1) ටෙහෙරාන් සමුළුව ය. (2) අත්ලාන්තික් සමුළුව ය.
(3) මොස්කව් සමුළුව ය. (4) සැන් ප්‍රැන්සිස්කෝ සමුළුව ය.

- පහත දැක්වෙන A හා B ප්‍රකාශ ඇසුරෙන් 35 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A – "නියෝජිතයන් නැතිනම් බදුත් නැත."
B – "මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත."

35. ඇමෙරිකානු නිදහස් සටන සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

36. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් රුසියානු විප්ලවය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) විප්ලවය ආරම්භක අවධියේ ගොවිජනතාව විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටියහ.
(2) සමාජවාදී දර්ශනය ලොවපුරා ව්‍යාප්තවීම රුසියානු විප්ලවයේ ප්‍රතිඵලයකි.
(3) ජනතාවගෙන් අධික ලෙස බදු අය කළ සාර් පාලනය ඉතා දූෂිත විය.
(4) එකල රුසියාවේ ධනවාදී ආර්ථික ක්‍රමයක් පැවතිණි.

- පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. ඒ එක් එක් ප්‍රකාශ යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර 37 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. නිරවි යුද්ධය
2. රහස් ඔත්තු සේවා

B – 1. නොබැඳි ජාතීන්ගේ සමුළුව
2. වින්ස්ටන් චර්චිල්

C – 1. යුදෙව් ජාතිකයන්
2. නට්සි හමුදාව

D – 1. ප්‍රංශ හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය
2. දෙවන ලෝක සංග්‍රාමය

37. පළමුවැන්නේ ක්‍රියාකාරිත්වය තීව්‍ර කිරීමට දෙවැන්නේ බලපෑම දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

38. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් නොදක්වන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්නේ බිඳ වැටීම කෙරෙහි දෙවැන්නේ බලපෑම දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

40. සූවස් ඇළ ජනසතු කිරීම හා නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට සහාය වීම නිසා ලෝක අවධානයට ලක් වූ ජන නායකයා,
(1) අබ්දුල් ගමල් නසාර් ය. (2) මහතීර් මොහොමඩ් ය.
(3) ජවහල්ලාල් නේරු ය. (4) මාෂල් ටිටෝ ය.

## 2021 - 2022

1. ශ්‍රී ලංකා ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,
(1) මහාවංසය ය. (2) දීපවංසය ය. (3) ධාතුවංසය ය. (4) ථූපවංසය ය.

2. ගල් තලා මත ලියා ඇති අභිලේඛන හඳුන්වනු ලබන්නේ කිනම් නමකින් ද?
(1) ගිරි ලිපි (2) ලෙන් ලිපි (3) ටැම් ලිපි (4) පුවරු ලිපි

3. ආදි බ්‍රාහ්මී සෙල්ලිපියක 'පුර කමත' නමින් හඳුන්වා ඇති නිලධාරියා වූයේ නගරයේ,
(1) පාලනය භාරව සිටි පුද්ගලයා ය. (2) ප්‍රධාන ආරක්ෂක නිලධාරියා ය.
(3) වෙළෙඳ කටයුතු භාර ප්‍රධානියා ය. (4) ප්‍රධාන වාස්තු ශිල්පියා ය.

4. ප්‍රාග් ඓතිහාසික මානවයන් වාසය කළේ යැයි සැලකෙන ස්ථාන අතුරෙන් වඩාත්ම පැරණි ස්ථාන වන්නේ,
(1) කිතුල්ගල බෙලිලෙන හා බෙල්ලන්බැඳිපැලැස්ස ය.
(2) පාහියන්ගල හා කුරුවිට බටදොඹලෙන ය.
(3) අත්තනගොඩ අළුලෙන හා මාතියම්ගම ය.
(4) සීගිරිය පොතාන හා සීගිරිය අලිගල ය.

5. රාජ්‍ය උරුමය පියාගෙන් පසු පුතාට හිමි වූ අවස්ථාවක් වන්නේ,
(1) දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය රජවීමයි.
(2) කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජවීමයි.
(3) පළමුවන විජයබාහු රජුගෙන් පසු පළමුවන පරාක්‍රමබාහු රජවීමයි.
(4) පළමුවන විමලධර්මසූරිය රජුගෙන් පසු සෙනරත් රජවීමයි.

6. නිශ්ශංකමල්ල රජතුමා විසින් භාවිත කළ රාජ්‍යත්ව සංකල්පය කුමක් ද?
(1) දේවත්ව (2) චක්‍රවර්ති (3) බෝධිසත්ව (4) පර්වතරාජ

7. ගල් ගුහා, වාසස්ථාන ලෙස සකස් කිරීමේදී ගල මතුපිටට වැටෙන වැසි ජලය ගුහාව තුළට ගලා ඒම වැළැක්වීමට අනුගමනය කළ ක්‍රියාමාර්ගය කුමක් ද?
(1) ගල් ගුහාව ඇතුළට හෑරීම (2) ගුහාව වටකර වරිච්චි බිත්ති බැඳීම
(3) ගල් ගුහාවේ කටාරම් කෙටීම (4) කළු ගල් යොදා ගුහාව ආවරණය කිරීම

8. ශ්‍රී දන්ත ධාතුව රැගෙන හේමමාලා කුමරිය හා දන්ත කුමරු ගොඩබට වරාය කුමක් ද?
(1) මාතොට (2) ගෝකණ්ණතිත්ථ (3) දඹකොලපටුන (4) ලංකාපටුන

9. රළපනාව මගින් ඉටුවන කාර්යය වන්නේ,
(1) වැව් බැම්ම සේදීයාම වැළැක්වීමයි.
(2) සොරොව්වට ඇතිවන ජල පීඩනය සමනය කිරීමයි.
(3) වැවෙහි අතිරික්ත ජලය පිට කිරීමයි.
(4) වැවෙහි එකතුවන රොන්මඩ ඇළවල්වලට ගලායාම වැළැක්වීමයි.

21. බෞද්ධාගමික පුනරුදය සඳහා අනගාරික ධර්මපාලතුමාගෙන් ඉටු වූ සේවාවක් වන්නේ,
(1) බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීමට කටයුතු කිරීමයි.
(2) බෞද්ධ කොඩිය නිර්මාණය කිරීමයි.
(3) පංච මහා වාද සඳහා අනුග්‍රහය දැක්වීමයි.
(4) වෙසක් පෝය නිවාඩු දිනයක් බවට පත් කිරීමට කටයුතු කිරීමයි.

22. ආරුමුග නාවලර්තුමා විසින් යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ,
(1) හින්දු සංස්කෘතිය දෙමළ සිසුන් අතර ප්‍රචාරය කිරීම ය.
(2) දක්ෂතා ඇති දෙමළ සිසුන් සඳහා නොමිලේ අධ්‍යාපනය ලබාදීම ය.
(3) දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට පාසලක් පිහිටුවීම ය.
(4) දෙමළ සිසුන් අතර ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රචලිත කිරීම ය.

23. ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා ටී. බී. ජයා මහතාගෙන් ඉටු වූ සේවාවක් වන්නේ,
(1) මුස්ලිම් නෙයිසන් පුවත්පත ආරම්භ කිරීම ය. (2) මුස්ලිම් ජනතාව වෙනුවෙන් පාසල් පිහිටුවීම ය.
(3) මුස්ලිම් කාන්තා විද්‍යාල ආරම්භ කිරීම ය. (4) කොළඹ මුස්ලිම් අධ්‍යාපන සංගමය පිහිටුවීම ය.

23. ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා ටී. බී. ජයා මහතාගෙන් ඉටු වූ සේවාවක් වන්නේ,
(1) මුස්ලිම් නෙයිසන් පුවත්පත ආරම්භ කිරීම ය. (2) මුස්ලිම් ජනතාව වෙනුවෙන් පාසල් පිහිටුවීම ය.
(3) මුස්ලිම් කාන්තා විද්‍යාල ආරම්භ කිරීම ය. (4) කොළඹ මුස්ලිම් අධ්‍යාපන සංගමය පිහිටුවීම ය.

24. සූරියමල් ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පළමුවන ලෝක මහා සංග්‍රාමයේදී ආබාධිත බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ට ආධාර එකතු කිරීමේ ව්‍යාපාරයක් විම
(2) ශ්‍රී ලංකාවේ නිදහස සඳහා ගෙනගිය උද්ඝෝෂණවල ප්‍රචාරක ව්‍යාපාරයක් වීම
(3) යුධ සාමදාන දිනය සැමරීම සඳහා සූරියමල් විකිණීමේ ව්‍යාපාරය ආරම්භ කිරීම
(4) සූරියමල් විකිණීමෙන් ලැබෙන මුදල් බ්‍රිතාන්‍ය මහා භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කිරීම

25. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් හඳුන්වා දෙනු ලැබූ ලක්ෂණයක් වන්නේ,
(1) පළාත්බද නියෝජනයයි. (2) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයයි.
(3) සර්වජන ඡන්ද බලයයි. (4) උඩරට හා පහතරට ඒකාබද්ධ පාලනයයි.

26. පහත A සිට D දක්වා වූ කරුණු අතුරෙන් බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික වෙනස්වීම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
A – අපනයන වැවිලි බෝග හඳුන්වාදීම
B – කෘෂිකර්මාන්තය දියුණු කිරීම රජයේ ප්‍රධාන වගකීම වීම
C – ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම
D – රාජකාරී ශ්‍රම ක්‍රමය ක්‍රියාත්මක කිරීම
(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D

27. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ අරමුණක් වූයේ,
(1) වියළි කලාපයේ පැරණි වැව් හා වාරිමාර්ග අළුත්වැඩියා කිරීමයි.
(2) කෘෂි නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීමයි.
(3) ඉහළ යන විදුලිබල ඉල්ලුම සඳහා විදුලිබලය නිෂ්පාදනය කිරීමයි.
(4) සුළු අපනයන බෝග වගා කිරීමට ඉඩම් වෙන් කිරීමයි.

28. පහත A සිට D දක්වා වූ මැතිවරණ අතුරෙන් සමස්ත ශ්‍රී ලංකාවම එකම ඡන්ද කොට්ඨාශයක් බවට පත්වන අවස්ථා දැක්වෙන පිළිතුර කුමක් ද?
A – ජනාධිපතිවරණය
B – මහ මැතිවරණය
C – පළාත් සභා මැතිවරණය
D – ජනමත විචාරණය
(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

29. පුනරුද සමයේ විවිධ සොයාගැනීම් කළ පුද්ගලයන් අතුරෙන් ඉංග්‍රීසි ජාතික විලියම් හාවේ ප්‍රසිද්ධියට පත් වූයේ කවර ක්ෂේත්‍රයක ද?
(1) චිත්‍ර කලාව (2) වෛද්‍ය විද්‍යාව (3) සාහිත්‍යය (4) දේශ ගවේෂණය

30. පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කමක් වන්නේ,
(1) ලෞකික රසවින්දනයට මුල්තැන දෙන කලා කෘති බිහිවීම ය.
(2) ශිල්පීන් අයත් වූ ශ්‍රේණිවල නමින් කලා නිර්මාණ එළිදැක්වීම ය.
(3) කලා කෘතිවලට අනුග්‍රහ දැක්වීමේ ශක්තිය පල්ලියට පමණක් තිබීම ය.
(4) කලා කෘති හා කලා ශිල්ප ආගමටම පමණක් නැඹුරු වීම ය.

31. කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය මගින් සිදු වූයේ,
(1) විශාල ඉඩම් කුඩා කොටස්වලට බෙදා වෙන් කිරීම ය.
(2) දිළින්දන් සතු ඉඩම් රදළයන් විසින් අත්පත් කරගැනීම ය.
(3) කාර්මික අවශ්‍යතා සඳහා ග්‍රාමීය ඉඩම් යොදාගැනීම ය.
(4) සුළු ගොවියන් සතු කුඩා ඉඩම් එකතු කර විශාල ගොවිපළවල් සකස් කිරීම ය.

10. අඹන් ගඟ හරස් කර ඉදිකරන ලද ඇළ මාර්ගය වන්නේ,
(1) යෝධ ඇළයි. (2) මිනිපේ ඇළයි. (3) අංගමැඩිල්ල ඇළයි. (4) ඇළහැර ඇළයි.

11. පහත A සිට D දක්වා වූ නිර්මාණ අතුරෙන් පැරණි ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය භාවිතයේ පරිණත අවස්ථාව සඳහා නිදසුන් ඇතුළත් පිළිතුර කුමක් ද?
A – මැටි ඔරු සුසාන
B – සීගිරියේ ජල මල්
C – වර්ණාලේපිත මැටි බඳුන
D – කුට්ටම් පොකුණ
(1) A හා C (2) B හා C (3) B හා D (4) C හා D

12. ස්වභාවික පරිසර ක්‍රියාවලිය පිළිබඳ දැනුම, තාක්ෂණය සඳහා භාවිත කළ අවස්ථාවක් වන්නේ,
(1) රුවන්වැලිසෑයේ අත්තිවාරම සැකසීමයි.
(2) මල්වතු ඔය හරහා ගල් පාලමක් ඉදිකිරීමයි.
(3) බලංගොඩ සමතළ වැව ප්‍රදේශයේ යකඩ නිස්සාරණ උදුන් සැකසීමයි.
(4) දැදිගම කොටවෙහෙර ඇත් පහන නිර්මාණය කිරීමයි.

13. 'දකපති' නමැති බදු වර්ගය අය කරනු ලැබුවේ මින් කුමක් සඳහා ද?
(1) හේන් වගා කිරීම (2) වැව්වල ජලය භාවිත කිරීම
(3) රජුට අයත් ඉඩම්වල වගා කිරීම (4) ඇළ මාර්ගවල මසුන් ඇල්ලීම

14. අතීත ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ නීති ඇතුළත් ශිලා ලේඛනයක් වන්නේ,
(1) සොරබොරවැව වැම් ලිපියයි. (2) මිහින්තලා පුවරු ලිපියයි.
(3) බෙවැල්කැටිය සෙල්ලිපියයි. (4) ගොඩවාය සෙල්ලිපියයි.

15. උස් බිම්වල වනාන්තර කැපීම නොකළ යුතු බවට නීති පැනවීමෙන් අතීත රජවරු බලාපොරොත්තු වූයේ,
(1) ජල උල්පත් සිඳීයාම වළක්වා ගැනීම ය.
(2) වැව්වලට රොන්මඩ එකතුවීම වළක්වා ගැනීම ය.
(3) වන සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා කර ගැනීම ය.
(4) වගාබිම්වල පස නිසරුවීම වළක්වා ගැනීම ය.

16. ජෝතිය සිටුවරයාගේ කැරැල්ල ඇති වූයේ මින් කිනම් රාජ්‍ය සමයකදී ද?
(1) පළමුවන විජයබාහු (2) පළමුවන පරාක්‍රමබාහු
(3) හයවන පරාක්‍රමබාහු (4) හයවන විජයබාහු

17. මහනුවර රාජධානියේ ඉඩම්, ඒවායේ අයිතිය හා භුක්තිය පදනම් කර බෙදනු කොටස් I තීරුවේ ද, ඒ එක් එක් කොටස පිළිබඳ පැහැදිලි කිරීම II තීරුවේ ද දක්වා ඇත. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ගබඩාගම් | A – රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් |
| 2. නින්දගම් | B – විහාරාරාම සඳහා පූජා කළ ඉඩම් |
| 3. විහාරගම් | C – රජු සහ රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් |
| | D – දේවාල සඳහා පූජා කළ ඉඩම් |

(1) ACD (2) BDA (3) CAB (4) CBD

18. පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට යාපන ප්‍රදේශයේ පාලකයා වූයේ,
(1) පරරාජසේකරම් ය. (2) එදිරිමානසිංහම් ය. (3) සංකිලි ය. (4) පුවිරාජපණ්ඩාරම් ය.

19. ක්‍රි.ව. 1848 නිදහස් අරගලයෙන් පසු දේශීය ජනතාවට සහන සැලසීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව ගත් ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) අත්අඩංගුවට ගත් දේශීය නායකයන් නිදහස් කිරීම ය.
(2) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම ය.
(3) ගොවි ජනතාවගේ ගැටලු විසඳීමට කමිටුවක් පත් කිරීම ය.
(4) බදු වර්ග කිහිපයක් අහෝසි කිරීම ය.

20. 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේදී නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හැඳින්වූ නම කුමක් ද?
(1) ව්‍යවස්ථාදායක සභාව (2) රාජ්‍ය මන්ත්‍රණ සභාව
(3) ජාතික රාජ්‍ය සභාව (4) සෙනෙට් සභාව

21. බෞද්ධාගමික පුනරුදය සඳහා අනගාරික ධර්මපාලතුමාගෙන් ඉටු වූ සේවාවක් වන්නේ,
(1) බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීමට කටයුතු කිරීමයි.
(2) බෞද්ධ කොඩිය නිර්මාණය කිරීමයි.
(3) පංච මහා වාද සඳහා අනුග්‍රහය දැක්වීමයි.
(4) වෙසක් පෝය නිවාඩු දිනයක් බවට පත් කිරීමට කටයුතු කිරීමයි.

**22.** ආරුමුග නාවලර්තුමා විසින් යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ,
(1) හින්දු සංස්කෘතිය දෙමළ සිසුන් අතර ප්‍රචාරය කිරීම ය.
(2) දක්ෂතා ඇති දෙමළ සිසුන් සඳහා නොමිලේ අධ්‍යාපනය ලබාදීම ය.
(3) දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට පාසලක් පිහිටුවීම ය.
(4) දෙමළ සිසුන් අතර ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රචලිත කිරීම ය.

**23.** ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා ටී. බී. ජයා මහතාගෙන් ඉටු වූ සේවාවක් වන්නේ,
(1) මුස්ලිම් නෙයිසන් පුවත්පත ආරම්භ කිරීම ය. (2) මුස්ලිම් ජනතාව වෙනුවෙන් පාසල් පිහිටුවීම ය.
(3) මුස්ලිම් කාන්තා විද්‍යාල ආරම්භ කිරීම ය. (4) කොළඹ මුස්ලිම් අධ්‍යාපන සංගමය පිහිටුවීම ය.

**24.** සූරියමල් ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පළමුවන ලෝක මහා සංග්‍රාමයේදී ආබාධිත බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ට ආධාර එකතු කිරීමේ ව්‍යාපාරයක් වීම
(2) ශ්‍රී ලංකාවේ නිදහස සඳහා ගෙනගිය උද්ඝෝෂණවල ප්‍රචාරක ව්‍යාපාරයක් වීම
(3) යුධ සාමදාන දිනය සැමරීම සඳහා සූරියමල් විකිණීමේ ව්‍යාපාරය ආරම්භ කිරීම
(4) සූරියමල් විකිණීමෙන් ලැබෙන මුදල් බ්‍රිතාන්‍ය මහා භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කිරීම

**25.** ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් හඳුන්වා දෙනු ලැබූ ලක්ෂණයක් වන්නේ,
(1) පළාත්බද නියෝජනයයි. (2) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයයි.
(3) සර්වජන ඡන්ද බලයයි. (4) උඩරට හා පහතරට ඒකාබද්ධ පාලනයයි.

**26.** පහත A සිට D දක්වා වූ කරුණු අතුරෙන් බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික වෙනස්වීම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
A – අපනයන වැවිලි බෝග හඳුන්වාදීම B – කෘෂිකර්මාන්තය දියුණු කිරීම රජයේ ප්‍රධාන වගකීම වීම
C – ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම D – රාජකාරි ශ්‍රම ක්‍රමය ක්‍රියාත්මක කිරීම
(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D

**27.** මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ අරමුණක් වූයේ,
(1) වියළි කලාපයේ පැරණි වැව් හා වාරිමාර්ග අළුත්වැඩියා කිරීමයි.
(2) කෘෂි නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීමයි.
(3) ඉහළ යන විදුලිබල ඉල්ලුම සඳහා විදුලිබලය නිෂ්පාදනය කිරීමයි.
(4) සුළු අපනයන බෝග වගා කිරීමට ඉඩම් වෙන් කිරීමයි.

**28.** පහත A සිට D දක්වා වූ මැතිවරණ අතුරෙන් සමස්ත ශ්‍රී ලංකාවම එකම ඡන්ද කොට්ඨාශයක් බවට පත්වන අවස්ථා දැක්වෙන පිළිතුර කුමක් ද?
A – ජනාධිපතිවරණය B – මහ මැතිවරණය
C – පළාත් සභා මැතිවරණය D – ජනමත විචාරණය
(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

**29.** පුනරුද සමයේ විවිධ සොයාගැනීම් කළ පුද්ගලයන් අතුරෙන් ඉංග්‍රීසි ජාතික විලියම් හාවේ ප්‍රසිද්ධියට පත් වූයේ කවර ක්ෂේත්‍රයක ද?
(1) චිත්‍ර කලාව (2) වෛද්‍ය විද්‍යාව (3) සාහිත්‍යය (4) දේශ ගවේෂණය

**30.** පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කමක් වන්නේ,
(1) ලෞකික රසවින්දනයට මුල්තැන දෙන කලා කෘති බිහිවීම ය.
(2) ශිල්පීන් අයත් වූ ශ්‍රේණිවල නමින් කලා නිර්මාණ එළිදැක්වීම ය.
(3) කලා කෘතිවලට අනුග්‍රහ දැක්වීමේ ශක්තිය පල්லියට පමණක් තිබීම ය.
(4) කලා කෘති හා කලා ශිල්ප ආගමටම පමණක් නැඹුරු වීම ය.

**31.** කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය මගින් සිදු වූයේ,
(1) විශාල ඉඩම් කුඩා කොටස්වලට බෙදා වෙන් කිරීම ය.
(2) දිළින්දන් සතු ඉඩම් රදළයන් විසින් අත්පත් කරගැනීම ය.
(3) කාර්මික අවශ්‍යතා සඳහා ග්‍රාමීය ඉඩම් යොදාගැනීම ය.
(4) සුළු ගොවියන් සතු කුඩා ඉඩම් එකතු කර විශාල ගොවිපළවල් සකස් කිරීම ය.

32. පහත අදහස් ඇතුළත් දේශපාලන දර්ශනය ලොවපුරා ව්‍යාප්ත වූයේ කිනම් විප්ලවයෙන් පසු ද?
- සමාජය සතු ධන සම්පත් පිළිබඳ පොදු අයිතිය පිළිගැනීම
- සෑම පුරවැසියකුටම තම කුසලතා ඉහළ නංවා ගැනීමට සමාන ඉඩක් ලබාදීම
- නිෂ්පාදන ඵල සියලුදෙනාටම බෙදී යාම

(1) අමෙරිකන් නිදහස් සටන (2) ප්‍රංශ විප්ලවය
(3) රුසියානු විප්ලවය (4) ඉංග්‍රීසි විප්ලවය

33. දෙවන ලෝක යුද්ධ සමයේදී සෙසු ආසියාතික රටවල් ආක්‍රමණය කළ ආසියාතික රාජ්‍යය වූයේ,
(1) ජපානයයි. (2) චීනයයි. (3) මොංගෝලියාවයි. (4) කොරියාවයි.

34. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනයන්ට පැවරී ඇති කාර්යයන් කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරෙන් මහා මණ්ඩලයට අයත් කාර්යයන් දැක්වෙන පිළිතුර කුමක් ද?
A – එක්සත් ජාතීන්ගේ භාරකාර ක්‍රමය යටතට ගත් ප්‍රදේශ පාලනය කිරීම
B – එක්සත් ජාතීන්ගේ සංවිධානයට නව සාමාජිකයන් බඳවා ගැනීම
C – එක්සත් ජාතීන්ගේ ආයතනවලට අවශ්‍ය නීති උපදෙස් ලබාදීම
D – ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහලේකම් පත් කිරීම

(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා D

- පහත වගුවේ A සිට J දක්වා වූ තොරතුරු ඇසුරෙන් 35 සහ 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රජතුමා | ස්ථානය | හමුදා ප්‍රධානියා |
|---|---|---|
| A. පළමුවන රාජසිංහ | D. ගන්නෝරුව | G. ජෙරොනිමෝ ද අසවේදු |
| B. පළමුවන විමලධර්මසූරිය | E. මුල්ලේරියාව | H. දියෝගෝ ද මෙලෝ |
| C. දෙවන රාජසිංහ | F. බලන | J. කොන්ස්තන්තීනු ද සා |

35. ගන්නෝරුව සටනට සම්බන්ධ වූ උඩරට රජතුමා හා පෘතුගීසි හමුදා ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා H (2) B හා J (3) C හා G (4) C හා H

36. පළමුවන විමලධර්මසූරිය රජතුමා පෘතුගීසීන් සමග සටන් කළ ස්ථානය හා එහිදී පෘතුගීසි හමුදාව මෙහෙය වූ ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) D හා G (2) D හා J (3) E හා J (4) F හා G

- පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 37 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A – මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොව පුරා උනන්දුවක් ඇති වීම
B – ලොව ප්‍රථම ලිඛිත සන්ධිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහි වීම

37. ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

- පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදීම
2. කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ

B – 1. මැතිවරණ ප්‍රතිසංස්කරණය
2. ව්‍යවස්ථාදායක සභාව හඳුන්වා දීම

C – 1. අග්‍රාණ්ඩුකාර ධුරය
2. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

D – 1. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. සමානුපාතික නියෝජන ක්‍රමය

38. පළමුවැන්න දෙවැන්නේ ප්‍රතිඵලයක් බවට දැක්විය හැකි යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න මගින් දෙවැන්න හඳුන්වාදුන් බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

40. දෙවැන්න ක්‍රියාත්මක වීමත් සමග පළමුවැන්න අහෝසි වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

## 2022 - 2023

1. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව රචනා වන කෘතිය මින් කුමක් ද?
   (1) දීපවංසය (2) මහාවංසය (3) පූජාවලිය (4) රාජාවලිය

2. ආක්‍රමණිකයකු වුවද, සාධාරණ හා නීතිගරුක පාලනයක් ගෙන ගිය බව මහාවංසයේ සඳහන් වන පාලකයා මින් කවරෙක් ද?
   (1) එළාර (2) රාජරාජ (3) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ (4) රාජේන්ද්‍ර චෝල

3. අත්හැර දැමූ වැව්ගම් හැඳින්වූ නම කුමක් ද?
   (1) පරිබිත්ත ගම් (2) අපරික්ඛිත්ත ගම් (3) නියම් ගම් (4) ඔළගම්

4. ගම් නායකයෙකු වීම සඳහා අවශ්‍ය යැයි සැලකුන වැදගත් ම සුදුසුකම මින් කුමක් ද?
   (1) දේශපාලන පළපුරුද්ද (2) ආර්ථික වශයෙන් වත් පොහොසත් වීම
   (3) ගම්වැසියන් අතර ජනප්‍රිය වීම (4) උසස් කුලයකින් පැවත ඒම

5. මෙරට පළාත්වලට බෙදා ඒ ඒ පළාත් භාරව ඇමතිවරුන් පත්කළ බවට සැලකෙන ප්‍රථම පාලකයා වන්නේ,
   (1) පණ්ඩුකාභය රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
   (3) වසභ රජතුමා ය. (4) පළමුවෙනි විජයබාහු රජතුමා ය.

6. පහත දැක්වෙන කරුණු අතුරෙන් රටේ ආර්ථිකය සවිමත් කිරීම සඳහා පළමුවන විජයබාහු රජතුමා අනුගමනය කළ වැදගත් පියවරක් වන්නේ,
   (1) පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම ය.
   (2) චෝලයන්ගෙන් රට මුදාගැනීම ය.
   (3) අසල්වැසි රටවල් සමග මිත්‍ර සබඳතා ඇතිකර ගැනීම ය.
   (4) මහාපරිමාණ වැව් අමුණු තැනවීම ආරම්භ කිරීම ය.

7. ආර්ථිකයට සිදු කළ සේවාව නිසා දේවත්වයට පත් වූ රජ කෙනෙකු වූයේ,
   (1) වසභ ය. (2) මහසෙන් ය. (3) ධාතුසේන ය. (4) මහා පරාක්‍රමබාහු ය.

8. පහත **I** තීරුවේ රජවරු කිහිපදෙනෙකු හා **II** තීරුවේ එම රජවරු සම්බන්ධ කරුණු කිහිපයක් දැක්වේ. **I** තීරුව අනුව **II** තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පණ්ඩුකාභය රජතුමා | A – දිවයින එක්සේසත් කිරීම |
| 2. භාතිකාභය රජතුමා | B – ප්‍රථමවරට ග්‍රාම සීමා නියම කිරීම |
| 3. දුටුගැමුණු රජතුමා | C – කලා වැව ඉදිකිරීම |
| | D – තානාපතිවරුන් රෝමයට යැවීම |

   (1) A, B හා C (2) A, C හා D (3) B, A හා C (4) B, D හා A

9. අතීතයේ සිට ශ්‍රී ලංකාව අන්තර්ජාතික වෙළෙඳ කටයුතුවලදී වැදගත් වීමට හේතුව වූයේ,
   (1) කුඩා දූපතක් වීමයි. (2) ඉන්දියාවෙන් වෙන්ව පිහිටා තිබීමයි.
   (3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීමයි. (4) ත්‍රිකුණාමලය වරායේ ස්වභාවික පිහිටීමයි.

10. වැවක බැම්ම ගිලා නොබැසීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ගයක් වූයේ මින් කුමක් ද?
   (1) පිහිටි ගලක් තෝරා වැව් බැම්ම ඉදිකිරීම (2) ශක්තිමත් කළු ගලෙන් වැව් බැම්ම ඉදිකිරීම
   (3) පිටවාන මගින් වැඩි ජලය පිටකිරීම (4) සලපනාව ශක්තිමත්ව ඉදිකිරීම

- පහත A සිට E දක්වා ප්‍රකාශ භාවිතා කිරීමෙන් 11 සහ 12 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A – උද්‍යාන සැලසුම්කරණය පිළිබඳ විශිෂ්ට දැනුමක් තිබීම
B – ආරක්ෂාව සඳහා දිය අගල් හා ගඩොල් ප්‍රාකාර භාවිත කිරීම
C – අත්තිවාරම සැකසීම නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන වීම
D – සනීපාරක්ෂාව හා ස්වස්ථතාව පිළිබඳ මනා දැනුමක් තිබීම
E – ශල්‍ය වෛද්‍ය උපකරණ භාවිත කළ බවට සාධක හමුවීම

**11.** සීගිරිය සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

**12.** ආලාහන පිරිවෙන සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

**13.** පානීය ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා කරගැනීම සඳහා අතීතයේ ඉදිකරන ලද නිර්මාණය කුමක් ද?
(1) පොකුණු (2) ආඩියා ළිං (3) උරාකැට ළිං (4) අමුණු

**14.** පරිසරය ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කළ යුතු නීතිරීති ඇතුළත් වූ අභිලේඛනය කුමක් ද?
(1) ගල්පොත සෙල්ලිපිය (2) අනුරාධපුර පුවරු ලිපිය
(3) පනාකඩුව තඹ සන්නස (4) තෝනිගල සෙල්ලිපිය

**15.** අපේ රටේ ඉතා පුරාණ කාලයේ සිට විසූ ජනතාව කැඳ වර්ග තම ආහාරය සඳහා එක්කර ගැනීමට ප්‍රධානතම හේතුව වූයේ කුමක් ද?
(1) සකසා ගැනීමට පහසු වීම (2) දිරවා ගැනීමට පහසු වීම
(3) කැඳ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සුලභ වීම (4) ශරීර ශක්තිය වර්ධනය වීම

**16.** කාලිංග මාඝ හා චන්ද්‍රභානු යන ආක්‍රමණිකයන්ගෙන් රට මුදාගත් පාලකයා
(1) පළමුවන විජයබාහු ය. (2) පළමුවන පරාක්‍රමබාහු ය.
(3) දෙවන පරාක්‍රමබාහු ය. (4) තුන්වන විජයබාහු ය.

**17.** ශ්‍රී ලංකාවේ පැවති රාජධානි කිහිපයක් I තීරුවේ ද, පැරණි පරිපාලන බෙදීම් කිහිපයක් II තීරුවේ ද දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අනුරාධපුරය | A – මායාරට |
| 2. මහනුවර | B – රජරට |
| 3. කෝට්ටේ | C – රුහුණුරට |
| | D – මලයරට |

(1) A, B හා C (2) A, B හා D (3) B, A හා C (4) B, D හා A

**18.** මහනුවර ප්‍රථමවරට ස්වාධීන රාජධානියක් ලෙස ගොඩනගන ලද රජතුමා
(1) පළමුවන රාජසිංහ ය. (2) සේනා සම්මත වික්‍රමබාහු ය.
(3) ජයවීර බණ්ඩාර ය. (4) පළමුවන විමලධර්මසූරිය ය.

- පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 19 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.

A – ජාතික රාජ්‍යයන් බිහිවීම
B – වෙළෙඳාමේ දියුණුව

**19.** යුරෝපයේ පුනරුදය සම්බන්ධයෙන්
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**20.** දුරදක්නය නිපදවනු ලැබුවේ කවුරුන් විසින් ද?
(1) නිකලස් කොපර්නිකස් (2) ජොහැන්නස් කෙප්ලර්
(3) ජොහැන්නස් ගුටෙන්බර්ග් (4) ගැලීලියෝ ගැලිලි

**21.** කාර්මික විප්ලව සමයේ සායම්, ඖෂධ, තෙල් සහ පොහොර යන අතුරු නිෂ්පාදන හේතුවෙන් දියුණුවට පත් කර්මාන්තය කුමක් ද?
(1) රෙදිපිළි කර්මාන්තය (2) යකඩ හා වානේ කර්මාන්තය
(3) ගල් අඟුරු කර්මාන්තය (4) කෘෂි කර්මාන්තය

**22.** කාර්මික විප්ලව සමයේ වගා කටයුතු සඳහා ශස්‍ය මාරු ක්‍රමය හඳුන්වාදීම මගින් සිදු වූ වාසියක් වන්නේ මින් කුමක් ද?
(1) වගාවට වැළඳෙන ලෙඩරෝග ව්‍යාප්තිය අවම වීම
(2) වැපිරීමට අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු කරගැනීමට හැකිවීම
(3) අවම ජල පහසුකම් යටතේ වගා කිරීමට හැකිවීම
(4) ඕනෑම කාලගුණ තත්වයකට වගාව ඔරොත්තු දීම

**23.** පහත A සිට D දක්වා දී ඇති ස්ථාන අතුරෙන් ඉංග්‍රීසීන් විසින් ඉන්දියාවේ පිහිටුවන ලද වෙළෙඳ මධ්‍යස්ථාන දැක්වෙන පිළිතුර කුමක් ද?
A – මදුරාසිය B – බොම්බාය
C – පොන්ඩිචෙරි D – චන්ද්‍රනගර්
(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

**24.** උඩරට රාජධානිය නිල වශයෙන් බ්‍රිතාන්‍යයන්ට පවරාදෙන ලද්දේ,
(1) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අත්අඩංගුවට පත් වූ පසුව ය.
(2) 1815 උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ය.
(3) 1818 ප්‍රකාශනයෙන් පසුව ය.
(4) 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවලින් පසුව ය.

**25.** ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ අවධානය යොමුවීමට ප්‍රධානතම හේතුව වූයේ,
(1) ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය රැකගැනීමේ අවශ්‍යතාවයයි.
(2) ත්‍රිකුණාමලය වරාය අවටින් වටිනා වෙළෙඳ ද්‍රව්‍ය ලබාගත හැකි වීමයි.
(3) විදේශ වෙළෙඳාම සඳහා සුදුසු වරායක් වීමයි.
(4) විශාල නැව් නවතා තැබිය හැකි වරායක් වීමයි.

**26.** ඉංග්‍රීසීන්ට මහනුවර රාජධානිය පහසුවෙන් යටත් කරගැනීමට තුඩුදුන් වැදගත් ම සාධකය වූයේ,
(1) මහජනතාව ඉංග්‍රීසීන්ට එකතු වීමයි.
(2) ඉංග්‍රීසීන්ගේ යුද ශක්තියයි.
(3) රජු හා මහජනතාව අතර සබඳතාව දුරස් වීමයි.
(4) ඉංග්‍රීසීන්ට මුහුදුබඩ වැසියන් සහයෝගය දැක්වීමයි.

**27.** කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවනු ලැබුවේ කවුරුන් විසින් ද?
(1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා (2) ඔරාබි පාෂාතුමා
(3) ඇම්.සී. සිද්දි ලෙබ්බේ මහතා (4) ටී.බී. ජයා මහතා

**28.** චර්ච් මිෂනාරි සංවිධානය විසින් පළකරන ලද ප්‍රකාශනය මින් කුමක් ද?
(1) ලක්මිණි පහන (2) මාසික තෑග්ග (3) ලංකා ලෝකය (4) සරසවි සඳරැස

**29.** යුරෝපීය ව්‍යාපාරිකයන් විසින් ගෙනගිය උද්ඝෝෂණවල ප්‍රධාන අරමුණ වූයේ මින් කුමක් ද?
(1) ආණ්ඩුකාරවරයාගේ බලතල සීමා කරගැනීම
(2) ව්‍යවස්ථාදායක සභාවට ජනවර්ග අනුව නියෝජිතයන් තේරීම අවලංගු කිරීම
(3) ව්‍යවස්ථාදායක සභාවට පත් කරන නිලලත් සාමාජික සංඛ්‍යාව වැඩි කර ගැනීම
(4) වතු වගාවට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කර ගැනීම

**30.** ඩොනමෝර් ප්‍රතිසංස්කරණය යටතේ ඡන්ද බලය හිමි වූයේ,
(1) උගත් ලාංකිකයන්ට පමණි. (2) වයස අවුරුදු 18 ට වැඩි පිරිමින්ට පමණි.
(3) වයස අවුරුදු 18 ට වැඩි සියලුම දෙනාටම ය. (4) වයස අවුරුදු 21 ට වැඩි සියලුම දෙනාටම ය.

**31.** ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා කවුද?
(1) ඩී. බී. ජයතිලක මහතා (2) එෆ්. ආර්. සේනානායක මහතා
(3) පොන්නම්බලම් අරුණාචලම් මහතා (4) ජේම්ස් පීරිස් මහතා

**32.** රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ලාංකික අමාත්‍යවරුන් සතු **නොවූ** විෂය ක්ෂේත්‍රයක් වන්නේ,
(1) අධ්‍යාපනයයි. (2) මුදල් කටයුතුයි. (3) පළාත් පාලනයයි. (4) සෞඛ්‍යයයි.

**33.** ශ්‍රී ලංකාවේ තේ වගාව සඳහා උචිත **නොවූ** ප්‍රදේශය මින් කුමක් ද?
(1) පහතරට තෙත් කලාපය (2) වියළි කලාපය
(3) කඳුකර තෙත් කලාපය (4) තෙත් උස් කඳුකර කලාපය

**34.** මෙරට දී සිංකෝනා වගාව අසාර්ථක වීමට මුල් වූ ප්‍රධානතම හේතුව කුමක් ද?
(1) වගාකරුවන්ට සිංකෝනා වගාව පිළිබඳ අවබෝධයක් නොතිබීම
(2) වගාව සඳහා මුදල් යෙදවීමට ප්‍රමාණවත් ආයෝජකයන් පිරිසක් නොමැති වීම
(3) බෙහෙත් පැළෑටියක් වීම නිසා සිංකෝනා සඳහා ඉල්ලුම සීමිත වීම
(4) සිංකෝනා වගාවට අවශ්‍ය සෙවන ලබාදීම සඳහා අමතර වියදමක් දැරීමට සිදුවීම

● පහත A සිට D දක්වා තොරතුරු ඇසුරෙන් **35** සහ **36** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව පත් කිරීම
B – අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේ බලය ජනාධිපතිවරයා සතු වීම
C – බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමග වූ ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම
D – අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා අගමැති වීම

**35.** 1972 ව්‍යවස්ථාව සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා D

**36.** 1978 ව්‍යවස්ථාව හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා D

● පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් **37** වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A – බොස්ටන් තේ සාදය
B – බැස්ටිලයට පහරදීම

**37.** ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

● පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර **38** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. පළමුවන ලෝක මහා සංග්‍රාමය
2. සරයේවෝ සිද්ධිය

B – 1. ජර්මනිය
2. මධ්‍ය බලවතුන්

C – 1. ආරක්ෂක මණ්ඩලය
2. ජාතීන්ගේ සංගමය

D – 1. දෙවන ලෝක මහා සංග්‍රාමය
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය

**38.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් **නොදැක්වෙන** යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**39.** පළමුවැන්න ඇතිවීමට දෙවැන්න හේතුවක් වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**40.** දෙවැන්න බිහිවූයේ පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

## 2023 - 2024

1. මහාවංස ටීකාව ලෙස හඳුන්වන කෘතිය කුමක් ද?
(1) දීපවංසය (2) වංසත්ථප්පකාසිනී (3) නිකාය සංග්‍රහය (4) රාජාවලිය

2. ශ්‍රී ලංකාවෙන් හමුවූ පැරණිතම කාසි කිනම් නමකින් හැඳින්වේ ද?
(1) කහාපණ (2) ස්වස්තික කාසි (3) ලක්ෂ්මී කාසි (4) තඹ මස්ස

● පහත A, B, C හා D ප්‍රකාශ ඇසුරෙන් 03 සහ 04 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A – පිළිස්සූ මැටි වළං භාවිත කිරීම
B – යකඩ ලෝහය භාවිත කිරීම
C – සංචාරක ජීවිතයක් ගත කිරීම
D – දෛනික කාර්යන් සඳහා ක්ෂුද්‍ර ගල් මෙවලම් භාවිතය

3. ප්‍රාග් ඓතිහාසික යුගය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

4. පූර්ව ඓතිහාසික යුගය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

5. පුරාණ ගම්වල ප්‍රධානියා හැඳින්වූ නම කුමක් ද?
(1) ගහපති (2) ගමික (3) පරුමක (4) මපුරුමුකා

6. අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට බලපෑ ප්‍රධාන සාධකය වූයේ,
(1) අන්තර්ජාතික වෙළෙඳාම ය.
(2) දිවයින වටා යා හැකි මාර්ග පද්ධතියක් පැවතීම ය.
(3) කෘෂිකර්මාන්තයට හිතකර වීම ය.
(4) රාජ්‍ය පාලනයට පහසුවීම ය.

7. ශ්‍රී ලාංකික රජවරුන් කිහිපදෙනකුගේ නම් **I තීරුවේ** ද, ඔවුන් හා සම්බන්ධ ඓතිහාසික සිදුවීම් **II තීරුවේ** ද දැක්වේ. **I තීරුව** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පණ්ඩුකාභය | A – මිරිසවැටි දාගැබ ඉදිකිරීම |
| 2. දේවානම්පියතිස්ස | B – අනුරාධපුරය අගනගරය බවට පත් කිරීම |
| 3. වළගම්බා | C – ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම |
| | D – ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම |

(1) A B C (2) B D C (3) C B A (4) D A B

8. සෑගිරි ඇමති විසින් පාලනය කළ ප්‍රදේශය කුමක් ද?
(1) රෝහණ දේශය (2) වන්නි ප්‍රදේශය (3) දක්ඛිණ දේශය (4) නාගදීපය

9. මලය රට හෙවත් මධ්‍ය කඳුකරය රජරට අවධියේදී වඩාත් ප්‍රසිද්ධියට පත් වීමට මුල් වූ හේතුව කුමක් ද?
(1) සුවදායක දේශගුණයක් පැවතීම
(2) ප්‍රධාන ගංගාවල පෝෂක ප්‍රදේශය වීම
(3) ආක්‍රමණ හා අභ්‍යන්තර අරගල අවස්ථාවලදී පාලකයින්ට ආරක්ෂක ස්ථානයක් වීම
(4) විදේශ වෙළෙඳාම සඳහා වෙළෙඳ ද්‍රව්‍ය සැපයූ ප්‍රදේශයක් වීම

10. ප්‍රථමවරට දිවයිනේ ග්‍රාම සීමා නියම කරවන ලද රජතුමා කවුරුන් ද?
(1) පණ්ඩුකාභය (2) දේවානම්පියතිස්ස (3) කාවන්තිස්ස (4) වසභ

● පහත ප්‍රකාශ ඇසුරෙන් අංක 11 සිට අංක 12 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – සකපෝරුව භාවිතයෙන් මැටි වළං තැනීම
B – අකුණුවලින් ආරක්ෂා වීමට අකුණු සන්නායක භාවිතය
C – සීගිරි උද්‍යානය නිර්මාණය කිරීම
D – ලම්බාකාරව බිත්ති බැඳීම

11. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) B සහ D

12. අනුරාධපුර යුගයේ තාක්ෂණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) B සහ D

13. අතීතයේ ශ්‍රී ලංකාවේ කාසිවල වටිනාකම තීරණය කිරීමට පදනම් වූ ප්‍රධාන සාධකය කුමක් ද?
(1) විශාලත්වය (2) ලෝහ බර (3) නිකුත් කළ වර්ෂය (4) නිකුත් කළ රට

14. ගෘහදණ්ඩ බද්ද යනු,
(1) වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අය කළ බද්දකි.
(2) රජුට අයත් ඉඩම් වගා කිරීම වෙනුවෙන් ගොවීන් විසින් රජයට ගෙවන ලද්දකි.
(3) ඇළ මාර්ගවල මසුන් ඇල්ලීම වෙනුවෙන් රජයට ගෙවිය යුතු බද්දකි.
(4) සැඟවී සිටි අපරාධකරුවන් අල්ලා ගන්නා තෙක් ඔවුන් ජීවත් වූ ගම්වල වැසියන්ගෙන් අය කරන ලද්දකි.

15. ශ්‍රී ලාංකික රජවරු කිහිපදෙනෙකුගේ නම් **I තීරුවේ** ද, ඔවුන්ගේ රාජධානි **II තීරුවේ** ද දැක්වේ. **I තීරුවේ** අනුපිළිවෙළට **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පළමුවන විජයබාහු | A – අනුරාධපුරය |
| 2. දෙවන පරාක්‍රමබාහු | B – පොළොන්නරුව |
| 3. දුටුගැමුණු | C – දඹදෙණිය |
| | D – මහනුවර |

(1) A C B (2) A D B (3) B C A (4) B D C

16. පළමුවන විජයබාහු රජතුමාගේ සේවාව ඇගයීමේදී ප්‍රමුඛත්වය දිය යුතු වැදගත්ම කරුණ කුමක් ද?
(1) විවාහ සබඳතා මගින් අසල්වැසි රටවල් සමග සබඳතා ගොඩනගා ගැනීම
(2) පිරිහීමට පත්ව තිබූ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම
(3) විදේශීය පාලනයෙන් මෙරට මුදවාගෙන රට එක්සත් කිරීම
(4) නටබුන්ව තිබූ වෙහෙර විහාර පිළිසකර කිරීම

17. ක්‍රිස්තු වර්ෂ 15 වන සියවස මැද්දී ක්‍රිස්තියානි සහ මුස්ලිම් භක්තිකයන් සටන් කළේ කුමන නගරයේ අයිතිය ලබාගැනීම උදෙසා ද?
(1) ජෙරුසලම් (2) කොන්ස්තන්තිනෝපල්
(3) රෝමය (4) වැනිසිය

18. පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් පිළිතුරු සපයන්න.
A – ආනයන අපනයන ආර්ථිකයක් බිහිවීම
B – මුදල් භාවිතය ප්‍රචලිත වීම
යුරෝපයේ ඇති වූ පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කළ බලපෑම සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

● A සිට D දක්වා ප්‍රකාශ ඇසුරෙන් 19 සහ 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A – ටිකිරි කුමරු විසින් මුල්ලේරියාවේදී පෘතුගීසීන් පැරදවීම
B – පෘතුගීසීන් විසින් රැජිණ ලෙස කුසුමාසන දේවිය නම් කිරීම
C – මායාදුන්නේ ආරම්භක පාලකයා වීම
D – මහා අස්ථාන කුමරු විසින් රන්දෙණිවලදී පෘතුගීසීන් පැරදවීම

19. සීතාවක රාජධානිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

20. මහනුවර රාජධානිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**19.** සීතාවක රාජධානිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**20.** මහනුවර රාජධානිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**21.** කෘෂිකර්මාන්තයේදී පේළියට වැපිරීමේ ක්‍රමය මගින් අත්වන වාසියක් වන්නේ,
(1) වගා භූමිවල හටගන්නා වල් පැළෑටි ප්‍රමාණය අඩු වීම ය.
(2) වගාවන්ට පොහොර යෙදීම පහසු වීම ය.
(3) වගාවට වැළඳෙන ලෙඩ රෝග ව්‍යාප්තිය අවම වීම ය.
(4) වැපිරීමට අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු කරගැනීමට හැකිවීම ය.

**22.** වර්ෂ 1818 නිදහස් සටන අසාර්ථක වීමට හේතු වූයේ,
(1) සත්කෝරළය හරහා උඩරටට හමුදා සහ අවි ආයුධ යැවීමට ඉංග්‍රීසීන්ට හැකිවීම ය.
(2) සාමාන්‍ය ජනතාවගේ සහයෝගය නොලැබීම ය.
(3) ගම්සභා ක්‍රමය අහෝසි කිරීම නිසා ජනතාව එක්රැස් කිරීම දුෂ්කර වීම ය.
(4) රජු ලෙස ඉදිරිපත් වූ තැනැත්තාට රාජ්‍ය උරුමයක් නොමැති බව හෙළිවීම ය.

**23.** පහත වගුවේ **I තීරුවෙන්** බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීමේදී වැදගත් වූ වර්ෂ ද **II තීරුවෙන්** එම වර්ෂවල වූ සිදුවීම් ද දැක්වේ. **I තීරුවට** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. 1796 | A – මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටතට ගැනීම |
| 2. 1802 | B – පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ පාලනය ආරම්භ වීම |
| 3. 1815 | C – ද්විත්ව පාලනය ආරම්භ වීම |
| | D – උඩරට රාජධානිය ඉංග්‍රීසීන් යටතට ගැනීම |

(1) A C B (2) B A D (3) C A B (4) D B C

**24.** වන්නාර්පන්නෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය පිහිටුවීමට පුරෝගාමී වූයේ කවුරුන් ද?
(1) ආරුමුග නාවලර්තුමා (2) පොන්නම්බලම් රාමනාදන්
(3) පොන්නම්බලම් අරුණාචලම් (4) නටේෂ අයියර්

**25.** ශ්‍රී ලංකාවේ විවිධ ජනවර්ගයන්ට අයත් පුද්ගලයන් රටේ යහපත උදෙසා ජාති ආගම් භේදයකින් තොරව ක්‍රියාකර ඇති අයුරු වඩාත් හොඳින් පිළිබිඹු වන සංවිධානය කුමක් ද?
(1) යාපනේ සංගමය (2) පහතරට වැවිලිකරුවන්ගේ සංගමය
(3) ලංකා ජාතික සංගමය (4) හලාවත සංගමය

**26.** අනුරාධපුරයේ බෞද්ධ අයිතීන් රැකගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ පුද්ගලයා වූයේ,
(1) අනගාරික ධර්මපාලතුමා ය. (2) පියදාස සිරිසේන ය.
(3) වලිසිංහ හරිස්චන්ද්‍රතුමා ය. (4) හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා ය.

- බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරෙන් **27** සහ **28** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A – අගමැතිවරයා
B – විධායක කාරක සභා ක්‍රමය
C – පාර්ලිමේන්තුව
D – ව්‍යවස්ථාදායක සභාව
E – පළාත්බද නියෝජනය

**27.** ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් ලක්ෂණය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**28.** සෝල්බරි ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A සහ C (2) A සහ D (3) B සහ C (4) B සහ E

**29.** යුරෝපීයන් විසින් ලංකාවට හඳුන්වා දුන් නව වැවිලි බෝග වන්නේ,
(1) සිංකෝනා, කොකෝවා, තේ සහ රබර් ය. (2) කෝපි, කුරුඳු, තේ සහ රබර් ය.
(3) කෝපි, කොකෝවා, තේ සහ පොල් ය. (4) කෝපි, තේ, රබර් සහ පොල් ය.

**30.** ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණායතනය පිහිටුවා ඇත්තේ කොහේ ද?
(1) ලුණුවිල (2) අගලවත්ත (3) තලවකැලේ (4) මාතලේ

**31.** ශ්‍රී ලංකාව ප්‍රථමවරට ඒකීය ජනරජයක් බවට පත් වූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?
(1) ඩොනමෝර් (2) සෝල්බරි (3) 1972 (4) 1978

**32.** රටේ ආර්ථික සංවර්ධනය සඳහා වැඩිම දායකත්වයක් ලබාදෙන ගංගාව කුමක් ද?
(1) මහවැලි (2) කැලණි (3) කළු (4) වලවේ

**33.** ජාතික වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් සෘජුවම මහජන මතය ලබාගන්නා ක්‍රමය කුමක් ද?
(1) පළාත් සභා මැතිවරණය (2) පාර්ලිමේන්තු මැතිවරණය
(3) ජනාධිපතිවරණය (4) ජනමත විචාරණය

**34.** පළමුවන ලෝක මහා සංග්‍රාමයේදී ජර්මනිය ඇතුළු මධ්‍යම බලවතුන්ගේ පිල පරාජය වීමට බලපෑ ප්‍රබලතම හේතුව වූයේ,
(1) ඇමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පිලට එකතු වීම ය.
(2) මධ්‍යම බලවතුන්ගේ පිලේ සිටි ඉතාලිය මිත්‍ර පිලට එකතු වීම ය.
(3) බ්‍රිතාන්‍යයට ශක්තිමත් නාවුක බලයක් තිබීම ය.
(4) ජර්මන් නාවුක හමුදාව තම අධිරාජයාට විරුද්ධව කැරලි ගැසීම ය.

**35.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියලුම සාමාජික රටවල් නියෝජනය කරන ප්‍රධාන ආයතනය කුමක් ද?
(1) භාරකාර මණ්ඩලය (2) ජාත්‍යන්තර අධිකරණය
(3) මහා මණ්ඩලය (4) ආර්ථික හා සමාජීය මණ්ඩලය

**36.** පළමුවන ලෝක යුද්ධයෙන් පසු වර්සෙල්ස් ගිවිසුම මගින් දැඩි දඬුවම්වලට භාජනය කළ රට කුමක් ද?
(1) ප්‍රංශය (2) ඉතාලිය (3) ජර්මනිය (4) රුසියාව

**37.** පහත A, B, C යටතේ ඇති සංවිධාන ඒවා බිහි වූ කාලය අනුව ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ සහිත පිළිතුර කුමක් ද?
A – එක්සත් ජාතීන්ගේ සංවිධානය
B – නොබැඳි ජාතීන්ගේ සංවිධානය
C – ජාතීන්ගේ සංගමය
(1) A B C (2) B C A (3) C A B (4) C B A

- පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. රාජාණ්ඩු ක්‍රමය
2. ප්‍රංශ විප්ලවය

B – 1. රුසියානු විප්ලවය
2. සමාජවාදී දර්ශනය

C – 1. ස්ටේට්ස් ජෙනරල් සභාව
2. රුසියානු විප්ලවය

D – 1. ඇමෙරිකානු විප්ලවය
2. බොස්ටන් තේ සාදය

**38.** දෙවැන්නේ ජයග්‍රහණයත් සමග පළමුවැන්න බිඳ වැටුණ බව දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**39.** පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවක් **නොදැක්වෙන** ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**40.** පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න ව්‍යාප්ත වූ බව දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

## 2016

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 02 | 21. | 04 |
| 02. | 01 | 22. | 02 |
| 03. | 03 | 23. | 03 |
| 04. | 04 | 24. | 03 |
| 05. | 04 | 25. | 04 |
| 06. | 02 | 26. | 03 |
| 07. | 01 | 27. | 02 |
| 08. | 03 | 28. | 04 |
| 09. | 02 | 29. | 03 |
| 10. | 03 | 30. | 01 |
| 11. | 01 | 31. | 03 |
| 12. | 03 | 32. | 01 |
| 13. | 02 | 33. | 02 |
| 14. | 04 | 34. | 02 |
| 15. | 01 | 35. | 03 |
| 16. | 04 | 36. | 01 |
| 17. | 02 | 37. | 02 |
| 18. | 01 | 38. | 04 |
| 19. | 03 | 39. | 03 |
| 20. | 02 | 40. | 02 |

## 2017

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 1 |
| 02. | 3 | 22. | 3 |
| 03. | 3 | 23. | 4 |
| 04. | 4 | 24. | 4 |
| 05. | 3 | 25. | 3 |
| 06. | 1 | 26. | 2 |
| 07. | 1 | 27. | 1 |
| 08. | 4 | 28. | 2 |
| 09. | 2 | 29. | 1 |
| 10. | 2 | 30. | 2 |
| 11. | 1 | 31. | 3 |
| 12. | 2 | 32. | 3 |
| 13. | 4 | 33. | 4 |
| 14. | 3 | 34. | 1 |
| 15. | 2 | 35. | 2 |
| 16. | 1 | 36. | 4 |
| 17. | 3 | 37. | 1 |
| 18. | 4 | 38. | 3 |
| 19. | 4 | 39. | 1 |
| 20. | 2 | 40. | 1 |

## 2018

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 01 | 11. | 02 | 21. | 03 | 31. | 02 |
| 02. | 03 | 12. | 04 | 22. | 02 | 32. | 04 |
| 03. | 04 | 13. | 03 | 23. | 04 | 33. | 01 |
| 04. | 02 | 14. | 01 | 24. | 03 | 34. | 03 |
| 05. | 01 | 15. | 02 | 25. | 01 | 35. | 01 |
| 06. | 03 | 16. | 01 | 26. | 04 | 36. | 01 |
| 07. | 02 | 17. | 01 | 27. | 01 | 37. | 03 |
| 08. | 03 | 18. | 03 | 28. | 02 | 38. | 04 |
| 09. | 02 | 19. | 01 | 29. | 03 | 39. | 04 |
| 10. | 04 | 20. | 03 | 30. | 02 | 40. | 02 |

## 2019

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 04 | 21. | 03 | 31. | 04 |
| 02. | 01 | 12. | 01 | 22. | 01 | 32. | 04 |
| 03. | 03 | 13. | 01 | 23. | 03 | 33. | 02 |
| 04. | 04 | 14. | 03 | 24. | 01 | 34. | 03 |
| 05. | 02 | 15. | 02 | 25. | 02 | 35. | 01 |
| 06. | 04 | 16. | 03 | 26. | 04 | 36. | 03 |
| 07. | 04 | 17. | 03 | 27. | 04 | 37. | 01 |
| 08. | 03 | 18. | 02 | 28. | 02 | 38. | 02 |
| 09. | 02 | 19. | 01 | 29. | 02 | 39. | 02 |
| 10. | 02 | 20. | 01 | 30. | 03 | 40. | 04 |

## 2020

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 1 | 31. | 4 |
| 02. | 3 | 12. | 3 | 22. | 1 | 32. | 3 |
| 03. | 4 | 13. | 1 | 23. | 3 | 33. | 4 |
| 04. | 2 | 14. | 1 | 24. | 4 | 34. | 4 |
| 05. | 3 | 15. | 3 | 25. | 2 | 35. | 3 |
| 06. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 4 |
| 07. | 1 | 17. | 4 | 27. | 2 | 37. | 1 |
| 08. | All | 18. | 3 | 28. | 3 | 38. | 2 |
| 09. | 3 | 19. | 3 | 29. | 1 | 39. | 4 |
| 10. | 2 | 20. | | 30. | 2 | 40. | 1 |

## 2021 (2022)

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 02 | 11. | 03 | 21. | 01 | 31. | 04 |
| 02. | 01 | 12. | 03 | 22. | 04 | 32. | 03 |
| 03. | 04 | 13. | 02 | 23. | 02 | 33. | 01 |
| 04. | 02 | 14. | 01 | 24. | 02 | 34. | 04 |
| 05. | 02 | 15. | 01 | 25. | 03 | 35. | 04 |
| 06. | 02 | 16. | 03 | 26. | 02 | 36. | 04 |
| 07. | 03 | 17. | 03 | 27. | 03 | 37. | 03 |
| 08. | 04 | 18. | 01 | 28. | 02 | 38. | 01 |
| 09. | 01 | 19. | 04 | 29. | 02 | 39. | 04 |
| 10. | 03/04 | 20. | 03 | 30. | 01 | 40. | 03 |

## 2022 (2023)

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 3 | 31. | 3 |
| 02. | 1 | 12. | 4 | 22. | 1 | 32. | 2 |
| 03. | 4 | 13. | 3 | 23. | 1 | 33. | 2 |
| 04. | 2 | 14. | 2 | 24. | 2 | 34. | 3 |
| 05. | 3 | 15. | 2 | 25. | 1 | 35. | 4 |
| 06. | 1 | 16. | 3 | 26. | 3 | 36. | 1 |
| 07. | 2 | 17. | 4 | 27. | 3 | 37. | 4 |
| 08. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 3 |
| 09. | 3 | 19. | 1 | 29. | 4 | 39. | 1 |
| 10. | 1 | 20. | 4 | 30. | 4 | 40. | 4 |

## 2023 (2024)

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 4 | 31. | 3 |
| 02. | 1 | 12. | 3 | 22. | 4 | 32. | 1 |
| 03. | 4 | 13. | 2 | 23. | 2 | 33. | 4 |
| 04. | 1 | 14. | 4 | 24. | 1 | 34. | 1 |
| 05. | 2 | 15. | 3 | 25. | 3 | 35. | 3 |
| 06. | 1 | 16. | 3 | 26. | 3 | 36. | 3 |
| 07. | 2 | 17. | 2 | 27. | 2 | 37. | 3 |
| 08. | 4 | 18. | 1 | 28. | 1 | 38. | 1 |
| 09. | 3 | 19. | 2 | 29. | 1 | 39. | 3 |
| 10. | 1 | 20. | 4 | 30. | 3 | 40. | 2 |